කාල් මාක්ස්
ෆෙඩ්රික් එංගල්ස්

1848

# කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය

පරිගනක පිටු සැකසුම: විමලා චාන්දනී, මංගලිකා වෙදගේ

මාක්ස්වාදීන්ගේ අන්තර්ජාල ලේඛනාගාරය
**www.marxists.org**

# පටුන


කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය 2

**I** ධනපතියෝ සහ නිර්ධනයෝ 3

**II** නිර්ධනයෝ සහ කොමියුනිස්ට්වාදියෝ 12

**III** සමාජවාදී සහ කොමිනියුනිස්ට්වාදී සාහිත්‍ය 20

1. ප්‍රතිගාමී සමාජවාදය 20

(අ) රදල සමාජවාදය 20

(ආ) සුළු ධනපති සමාජවාදය 21

(ඇ) ජර්මන් හෙවත් සැබෑ සමාජවාදය 22

2. ගතානුගතික හෙවත් ධනපති සමාජවාදය 24

3. විවේචක - මනෝරාජික සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය 25

**IV** විවිධ රටවල විරුද්ධ පක්ෂ සම්බන්ධව කොමියුනිස්ට්වාදීන්ගේ ස්ථාවරය 28

# කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය

අවතාරයක් යුරෝපයේ හොල්මන් කරයි - එය කොමියුනිස්ට්වාදයේ අවතාරයය. පාප් වහන්සේ සහ සාර් රජුද, මෙටර්නිහ් සහ ගීසෝද, ප්‍රංශයේ රැඩිල්වරු සහ ජර්මන් පොලිස් ඔත්තුකරුවෝද යන මේ පැරනි යුරෝපයේ සියලූ බලවේග මෙම අවතාරය පලවා හැරීම පිනිස ශුද්ධවූ ගිවිසුමකට එලඹ සිටිති.

බලයට පත් වූ සිය ප්‍රතිවාදීන් විසින් කොමියුනිස්ට්වාදීන් යයි හෙලා දකිනු නොලැබූ විපක්ෂයක් ඇත්තේ කොහේද? තමන්ට වඩා ප්‍රගාමී විපක්ෂවලට විරුද්ධව මෙන්ම තමන්ගේ ප්‍රතිගාමී පසමිතුරන්ට විරුද්ධවද කොමියුනිස්ට්වාදය නැමැති හංවඩු ගසනලද දෝෂාරෝපනය ආපසු දමා නොගැසූ විපක්ෂයක් ඇත්තේ කොහේද?

මෙම කරුනෙන් පැන නගින ප්‍රතිඵල දෙකකි.

කොමියුනිස්ට්වාදය දැනටමත් සියලු යුරෝපා බලවේගයන් විසින් බලයක් ලෙස පිලිගෙන ඇත්තේය.

කොමියුනිස්ට්වාදීන් ස්වකීය පක්ෂයේම ප්‍රකාශනයක් මගින් මුළුමහත් ලෝකය ඉදිරියෙහි විවෘත ලෙස ස්වකීය අදහස්ද, ස්වකීය අරමුනුද, ස්වකීය ප්‍රවනතාවයන්ද ප්‍රකාශ කල යුතු, කොමියුනිස්ට් අවතාරයපිලිඹඳ ළමා කතන්දරවලට පිළිතුරු සැපයිය යුතු කාලය පැමින ඇත.

මේ පරමාර්ථය පෙරදැරි කරගෙන විවිධ ජාතීන් නියෝජනය කරන කොමියුනිස්ට්වාදීහු ලන්ඩනයට ඒකරාශී වී පහත සටහන් ප්‍රකාශනය ලියා ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ඉතාලි, ප්ලෙමිෂ් සහ ඩෙන්මාක් භාෂාවලින් මුද්‍රනය කිරීමට තීරනය කළහ.

# I. ධනපතියෝ සහ නිර්ධනයෝ

මෙතෙක් පැවති සියලු සමාජ වල ඉතිහාසය පංති අරගල වල ඉතිහාසය වේ.

නිදහස් මිනිසා සහ වහලාද රෝම කුලීනයා සහ රෝම පොදු ජනයාද රදලයා සහ ප්‍රවේණිදාසයාද ශ්‍රේණි හිමියා සහ ජ්‍යෙෂ්ඨ ආධුනිකයාද - වචනයකින් පැහැදිලි කළහොත් පීඩකයා සහ පීඩිතයා එකිනෙකාට විරුද්ධව නියත ලෙස නැගීසිට වරෙක සැඟ'වුනාවූද වරෙක විවෘත වූද සටනක් එක්කෝ මුළු මහත් සමාජයම විප්ලවවාදී ලෙස ප්‍රති නිර්මාණය කිරීමෙන් අවසන් වූ නැත්නම් සටන් කරන පංතීන්ගේ පොදු විනාශයෙන් අවසන් වූ සටනක් නොකඩවාම කරගෙන ගියහ.

ඉතිහාසයේ ආදි යුගවලදී විවිධ ස්තරවලට බෙදන ලද පූර්ණ සැකැස්මක් සමාජීය තරාතිරම් වල විවිධ සරණී කරණයක් හැම තැනකදීම පාහේ අපි දකිමු. පැරණි රෝමයෙහි කුලීනයින්ද අසරුවන්ද පොදු ජනයාද වහලුන්ද මධ්‍ය කාලීනයුග වලදී රදල අධිපතියන්ද ඔවුන්ගේ ගැත්තන්ද ශ්‍රේනි හිමියන්ද ජ්‍යෙෂ්ඨ ආධුනිකයන්ද (සිප්කැමියන්ද) ප්‍රවේණිදාසයන්ද අපි දකිමු. තවද මේ සියලු පංතීන් තුළම පාහේ තවත් අප්‍රධාන සරණී කරනයන් විය.

රදල සමාජයේ නශ්ඨාවශේෂවලින් ඇතිවුනු සමකාලීන ධනපති සමාජය පංති ප්‍රතිඝතයන් විනාශකර නැත. එය අලුත් පංතීන්, පෑගීම සඳහා නව තත්ත්වයන්, පැරණි සටන් ක්‍රම වෙනුවට අලුත් සටන් ක්‍රමද එය ඉදිරිපත් කළා පමණකි.

ධනපති පංතියේ යුගය වන අපේ මෙම යුගයට අයත් විශේෂ ලක්ෂණය නම් එය පංති ප්‍රතිඝතය සරළ කිරීමයි. සමස්තයක් වශයෙන් සමාජය වැඩි වැඩියෙන් එකිනෙක සතුරු මහ කඳවුරු දෙකකට, එකිනෙකාට එරෙහිව මුහුණට මුහුණලා සිටින මහා පංතීන් දෙකකට, ධනපති හා කම්කරු නැමති පංති දෙකකට බෙදෙමින් පවතී.

මධ්‍ය කාලීන යුගයේ ප්‍රවේණිදාසයන්ගෙන් ආදී නගර වල නිදහස් ජනගහනය ඇතිවිය. මේ නාගරිකයන්ගෙන් ධනපති පන්තියේ ප්‍රථම කොටස් ඇතිවිය.

ඇමරිකාව සොයාගැනීමත් අප්‍රිකාව වටා යාමට මුහුදු මාර්ගය සොයාගැනීමත් නිසා නැගී ආ ධනපති පංතියට අලුත් ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් ඇති විය. පෙරදිග ඉන්දියානු සහ චීන වෙළඳ පොළවල්ද, ඇමරිකාව යටත් විජිත කරණයට හසුවීමද, යටත්විජිත සමග වෙලදාමද, හුවමාරු කිරීමේ මාධ්‍යයන් සහ වෙළඳ භාණ්ඩ වල වැඩිවීමද නිසා වාණිජයටත් නෞකා ගමනටත් කර්මාන්තයටත් ගරා වැටෙමින් පැවති රදළ සමාජයේ සිටි විප්ලවීය කොටසට සීඝ්‍ර වර්ධනයක් ලබා දුන්නේය.

ශිල්පීන් අල්ප සංඛ්‍යාවකට සීමාවී තිබුණු ශ්‍රෙණි මගින් කාර්මික නිෂ්පාදනය මත ඒකාධිකාරයක් අයත් කරැ ගෙන සිටි පැරණි රදළ වාදයට වැඩිවෙමින් පැවති අලුත් වෙළඳ පොළවල්වල වර්ධනය වන ඉල්ලුම තවදුරටත් සපුරාලීමට නොහැකි විය. එය වෙනුවට හස්තෝපක්‍රම කර්මාන්තය ඇති විය. භාණ්ඩ සාදන මැද පංතිය විසින් ශ්‍රෙණි ශිල්පීන් පසෙකට තල්ලු කැරිණි. සාමූහික ශ්‍රෙණි අතර පැවති ශ්‍රම විභජනය ඉදිරියෙහි අතුරුදහන් විය.

එහෙත් වෙළඳපොලවල් නොනැවතී වැඩෙන්නට වූ අතර ඉල්ලුමද එන්ට එන්ටම වැඩිවිය. හස්තෝපක්‍රම කර්මාන්තයට පවා එම ඉල්ලුම සපුරාලීමට තවදුරටත් නොහැකි විය. එවිට වාෂ්ප සහ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ විසින් කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයේ විප්ලවයක් ඇති විණි. හස්තෝපක්‍රම කර්මාන්තය වෙනුවට නවීන මහා පරිමාණ යෝධමය කර්මාන්තය ඇතිවිය. කාර්මික මැද පංතියට අයත් ස්ථානය දස ලක්ෂාධිපති ධන හිමි කර්මාන්ත කරුවෝ, කර්මාන්ත හමුදා මෙහෙයවන නායකයෝ, සමකාලීන ධනපති පංතිය අයත් කරැ ගත්හ.

මහා පරිමාණ කර්මාන්තය සමස්ත ලෝක වෙළඳ පොළක් බිහි කළේය. මෙයට මග හෙළි කරන ලද්දේ ඇමරිකාව සොයා ගැනීම විසිනි සමස්ත ලෝක වෙළඳපොල වෙළඳාමේත් නෞකා ගමනයේත් ගොඩබිම ගමනාගමනයේත් ඉමහත් සංවර්ධනයක් ඇති කළේය. මෙය යලි කර්මාන්ත ව්‍යාප්ත

කිරීමෙහිලා බල පෑමක් ඇති කළේය. එමෙන්ම කර්මාන්තය වෙළදාම නෞකා ගමනය දුම්රිය සේවාව වර්ධනය වූ ප්‍රමාණයටම සමානුපාතිකව ධනපති පංතිය වැඩිදියුණු වී සිය ප්‍රාග්ධනය වැඩි කැරැගෙන මධ්‍යම යුග වලින් දායාද වශයෙන් පැවත ආ සියලු පංති පසුතලයට ඇද දැම්මේය.

මේ නයින් සමකාලීන ධනපති පංතිය දීර්ඝ කාලීන සංවර්ධන ක්‍රියාදාමයක ඵලයක් බවත් භාණ්ඩ නිෂ්පාදන විධිවල සහ හුවමාරුවල ඇති වූ පෙරළි මාලාවක ඵලයක් බවත් අපි දකිමු.

ධනපති පංතියේ දියුණුවේ සෑම පියවරක් සමගම ඊට අනුරූපව එම පංතියේ දේශපාලන ප්‍රගමනයක්ද ඇතිවිය. රදළ කුලීන ආධිපත්‍යය යටතේ පීඩිත පංතියක් වූ, මධ්‍යකාලීන කොමියුනය තුළ අවිගත් ස්වයං පාලක සංගමයක් වූ (ඉතාලියේ සහ ජර්මනියේ මෙනි), එක් තැනක ස්වාධීන නාගරික සමූහාණ්ඩුවක් වූ (ප්‍රංශය මෙනි), තවත් තැනෙක රාජාණ්ඩුවට අයබදු ගෙවිය යුතු තෙවැනි ප්‍රජාව වූ, ඉන් ඉක්බිතිව හස්තෝපක්‍රම කර්මාන්ත පැවති අවධියේදී රදළ ප්‍රභූවරුන්ට විරුද්ධව පාවිච්චි කළ බලවේගයක් ලෙස අර්ධ රදළවාදයට හෝ පරම රාජාණ්ඩුවට හො සේවය කළ පොදුවේ මහා රාජාණ්ඩුවල ප්‍රධාන මුල්ගල වූ ධනපති පංතිය අවසානයේදී සමකාලීන මහා කර්මාන්තය සහ සමස්ත ලෝක වෙළඳ පොළ පිහිටුවාලීමෙන් අනතුරුව නියෝජිත සම කාලීන රාජ්‍යයන් තුළ තමාට පමණක් සීමා වූ සුවිශේෂ දේශපාලනමය ආධිපත්‍යයක් ලබාගෙන සිටී සමකාලීන රාජ්‍ය බලය අන් කිසිවක් නොව මුලු මහත් ධනපති පංතියේම පොදු කටයුතු මෙහෙයවන කාරක මණ්ඩලයක් පමණකි.

ධනපති පංතිය ඉතිහාසයෙහි අති විප්ලවීය ක්‍රියා කළාපයක් ඉටුකර ඇත.

ධනපති පංතිය ආධිපත්‍යය ලැබූ හැම තැනෙකම සියලු රදළවාදී පීතෘ මූලික පරමාදර්ශී (චාන් ගැමි ජීවිත) සබඳකම් විනාශ කළේය. “ස්වාභාවික ස්වාමිවරුන්ට” මිනිසා බැඳ තිබුනු අනේකවිධ රදළවාදී බන්ධනයන් අනුකම්පා විරහිත ලෙස සිඳ බිඳ දැමූ ධනපති පංතිය මිනිහකු සහ මිනිහකු අතර නග්න ස්වාර්ථකාමය හැර, අනුකම්පා විරහිත ලෙස මුදල් ගෙවීම හැර, වෙනත් කිසුදු සබඳකමක් ඉතිරි නොකළේය. ආගමික භක්තියද ධීර - වීර උනන්දුවද අවරසිකවාදී අනුරක්තතාවයද අරභයා වූ ස්වර්ගමය ආනන්දයන් ආත්මාර්තකාමී ගණන්බැලීම නැමැති අයිස් වතුරෙහි ගිල්වා දමන ලදි. එය පෞද්ගලික අගය හුවමාරු වටිනාකම බවට පෙරලන ලදි. එමෙන්ම සංඛ්‍යා විරහිත , උදුරාගත නොහැකි, වර සහිත නිදහස් අයිතීන් වෙනුවට හෘද සාක්ෂියට ගොහෙත්ම එකග නොවන එකම නිදහස වන වෙළදාම් කිරීමේ නිදහස පිහිටුවාලීය. වචනයකින් කියතොත් ආගමික සහ දේශපාලනික මායාවන්ගෙන් වාසා තිබුණු සූරාකෑම වෙනුවට එය විවෘත ලජ්ජා විරහිත සෘජු කෲර සූරාකෑම ආදේශ කළේය.

මෙතෙක් ගරුත්වයට භාජනය වූ ගෞරව පූර්වක විස්මයකින් යුතුව සැළකූ හැම වෘත්තියකම තිබූ ප්‍රභා මණ්ඩලය ධනපති පංතිය විසින් ඉවත් කැරිණි. එය වෛද්‍යවරයා, නීතිවේදියා, පූජකයා, කවියා, විද්‍ය කටයුතු වල නිරතවන්නා ආදී හැම කෙනෙක්ම වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කළේය.

ධනපති පංතිය පවුලේ සිත් ගන්නා සුලු අනුරක්තතාවයේ ආකල්ප බිඳදමා එය හුදු මුදල් පිළිබඳ ආකල්පයක් දක්වා පහත හෙලීය. ප්‍රගතිගාමීන්ගේ අභිමාණයට පාත්‍ර වූ මධ්‍ය කාලීන යුගවල පැවති තිරිසන් ලෙස සවිශක්තිය විදහා පෙන්වීමේ ගතිය ඉතා කම්මැළි කුසීතබාවය තුළ ඊට ගැලපෙන ප්‍රතිවිරුද්ධ ගතිය සොයා ගැනීම කෙසේ සිදුවීද යන්න ධනපති පංතිය හෙළි කළේය. මිනිස් ක්‍රියාකාරීත්වයට ලබාගත හැකි දේ මොනවාද යන්න එය ප්‍රථම වරට පෙන්වීය. මිසරයේ පිරමීඩ්, රෝමයේ වාරිමාර්ග(ජල මාර්ග), ගොතික් කලාව අනුව ඉදිකළ දේවස්ථාන වැනි වෙනත් වර්ගයකට අයත් විශ්මයජනක කලා වස්තූන් එය නිර්මාණය කළේය. ඊට කලින් පැවති ජාතීන්ගේ දේශාටනයන් සහ කුරුස යුද්ධ සියල්ලට වඩා වෙනත් වර්ග වල මහා ප්‍රයාන වල එය යෙදුනේය.

ස්ථාවර ලෙසම නිෂ්පාදන උපකරණ වල පෙරළියක් ඇති නොකර, එමගින් නිෂ්පාදන සම්බන්ධකම් සහ සමාජයේ මුලු මහත් සම්බන්ධකම් වල සමස්ථයද විප්ලවීය වෙනසකට භාජනය නොකොට,

ධනපති පංතියට පැවතිය නොහැකිය. අනික් අතින් ඊට කලින් ඇතිවූ සියලු කාර්මික පංතීන්ගේ පැවැත්මට අවශ්‍ය වූ පළමුවැනි කොන්දේසිය වූයේ වෙනස් නොවන අන්දමකින් පැරණි නිෂ්පාදන ක්‍රම පවත්වාගෙන යාමය. නිෂ්පාදනයෙහි ඇතිවන ස්ථාවර විප්ලවීය වෙනස්වීම්, සියලු සාමාජීය සබඳතාවයන් වල අතිවන නිරන්තර කැළඹීම්, සදාකාලික අවිනිශ්චිතතාවය සහ ගාමකත්වය විසින් ධනවාදී යුගය අන් සියලු යුග වලට වඩා වෙනස් වේ. සිය පෞරාණික වූත් පූජනීය වූත් ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණීභූත යකඩ මළ බැඳුණු සියලු සබඳතාවයන් විනාශ වී යන අතර අලුතින් ඇතිවන සියලු සබඳතාවයන් අස්ථිකරණයට භාජනය වීමටත් පෙර ඒවා යල්පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණු වී වාතය බවට පෙරළේ. ශුද්ධ වූ හැම දෙයක්ම කෙලෙසන්නේය. අවසානයේදී මිනිසාට තම ජීවන තත්වයන් සහ තම වර්ගයා සමග ඇති අන්‍යෝන්‍ය සබඳතාවයන් දෙස සන්සුන් සිතින් බැලීමට අවශ්‍යතාවයක් ඇතිවේ.

සිය නිෂ්පාදන භාණ්ඩ වලට නියත ලෙසම විශාල වෙමින් පවතිව වෙළඳපොලක් සොයා ගැනීමේ අවශ්‍යතාවය විසින් මුලු මහත් ලෝකගෝලය වටා ධනපති පංතියට දුවන්නට සිදුවෙයි. එයට හැම තැනටම රිංගන්නටද හැම තැනකම පදිංචි වීමටද හැම තැනකම සම්බන්ධකම් ඇතිකර ගැනීමටද සිදුවේ.

ධනපති පංතිය සමස්ථ ලෝක වෙළඳපොල සූරාකෑම තුළින් හැම රටකම නිශ්පාදනයට සහ පරිභෝජනයට නිර්ජාතික සාර්ව භෞමික ස්වරූපයක් දී ඇත. එය ප්‍රතිගාමීන් මහත් සේ කනස්සල්ලට පත්කරමින් කර්මාන්තයේ ජාතික පදනම එහි පා යටින් ඉවතට ඇද දමා ඇත. පුරාණ චිරාගත ජාතික කර්මාන්ත විනාශ කර දමන ලදි. නැතිනම් දිනපතා ඒවා විනාශකර දමනු ලැබේ. සියලු සභ්‍ය ජාතීන් ඉදිරියෙහි ඇති ජීවිතයත් මරණයත් අතර ප්‍රශ්න විසදාලීමක් වශයෙන් අභිනවයෙන් ආරම්භ කළ යුතු නව කර්මාන්ත මගින් තව දුරටත් දේශිය අමුද්‍රව්‍ය වලින් නොව ලෝකයේ ඉතා ඈත පෙදෙස් වලින් ගෙනෙනු ලබන අමුද්‍රව්‍ය වලින් වැඩකරන කර්මාන්ත මගින් එක් රටක් තුළ පමණක් නොව ලෝක ගෝලයේ හැම දිසාවෙකම පරිභෝජනයට ගන්නා භාණ්ඩ නිපදවන කර්මාන්ත මගින් පැරණි කර්මාන්ත පළවාහරිනු ලැබේ. රටක ජාතික නිෂ්පාදනය මගින් සෑහීමකට පත්කරනු ලබන පැරණි අවශ්‍යතාවයන් වෙනුවට ඈත සහ විවිධ දේශගුණික රටවලට අයත් නිෂ්පාදන මගින් පමණක් සෑහීමට පත්කළ හැකි නව අවශ්‍යතාවයන් පැන නගී. පැරණි ප්‍රාදේශිය සහ ජාතික හුදකලාතාවය සහ ස්වයංපෝෂිතතාවය වෙනුවට සමස්ථ ලෝක අන්තර් ආවේදනයක්ද එක් ජාතියක් තවත් ජාතියක් මත රදාපවතින සමස්ථ ලෝක අන්‍යෝන්‍ය පරායක්තතාවයක්ද ඇතිවේ. මෙය ද්‍රව්‍යමය නිෂ්පාදන වලට මෙන්ම අධ්‍යාත්මික නිර්මාණ වලට එකසේ බලපායි. එක් ජාතියකගේ අධ්‍යාත්මික නිර්මාණයේ ඵල සියලු ජාතීන්ගේ පොදු දායාද බවට පත්වේ. ජාතික ඒක පාර්ශ්විකත්වය සහ සීමා සහිත පටු බුද්ධිය වඩ වඩාත් නොකළ හැකි දෙයක් බවට පත්වේ. ජාතික හා පලාත්බද සාහිත්‍යයන්ගේ බහු සංඛ්‍යාවක් විසින් ජගත් සාහිත්‍යයත් බිහිවෙයි.

සියලු නිශ්පාදන උපකරණ වල සීඝ්‍ර දියුණුව මගින්ද ඉමහත් ලෙස පහසු වන ප්‍රවාහන සහ පණිවුඩ මගින්ද ධනපති පංතිය අති ම්ලේච්ඡ ජාතීන් ඇතුලු සියලු ජාතීන් සභ්‍යත්වය වෙතට ඇදගනී. ධනපති භාන්ඩ වල ලාභ මිළ මහා කාලතුවක්කු වලට සමානය. මෙය පාවිච්චි කරමින් ධනපති පංතිය සියලු චීන ප්‍රාකාර බිඳ දමයි. ම්ලේච්ඡයින් තුළ විදේශකයන් කෙරෙහි ඇතිවන මුරණ්ඩු ද්වේශ සහගත වෛරය මෙල්ල කරලයි. වඳවී යාමේ භීතිය ඉදිරියේ ඉන් මිදෙනු පිණිස ධනවාදී නිෂ්පාදන ක්‍රමය පිළිගන්නා ලෙස එය සියලු ජාතීන්ට බලකර සිටී. ඔවුනට ඊනියා ශිෂ්ඨත්වය එනම් ධනපතිවාදය පිළිගන්නා ලෙද බලකර සිටී. වචනයකින් පවසතොත් ධනපති පංතිය තම ප්‍රතිමූර්තියක් සහ තමාට සමාන ලෝකයක් මවාලයි.

ධනපති පංතිය ගම නගරයේ ආධිපත්‍යයට යටකර දමයි. එය අතිවිශාල නගර ඉදිකර ඇත. ගැමි ජනගහනය සමග සන්සන්දනය කරන විට නගරබද ජනගහනය සංඛ්‍යාව අතින් වැඩි කළේය. ඒ නයින් ජනගහනයෙන් සෑහෙන කොටසක් ගම්බද ජීවිතයේ මුග්ධභාවයෙන් මුදවා ගත්තේය. එය ගම නගරයට පරාධීන කළාක් මෙන්ම ම්ලේච්ඡ සහ අර්ධ ම්ලේච්ඡ රටවල් සභ්‍ය රට වලට පරාධීන කළේය. ගොවීන්ගෙන් සමන්විත ජාතීන් ධනපතීන්ගෙන් සමන්විත ජාතීන්ටද නැගෙනහිර බටහිරටද පරාධීන කළේය.

ධනපති පංතිය ජනගහණයත් නිෂ්පාදන මාධ්‍යයන් සහ දේපොළත් විසුරුම වඩ වඩාත් අහෝසිකරු දැමීමෙහි යෙදීසිටී. එය ජනගහණය පිණ්ඩිත කොට නිෂ්පාදන මාධ්‍යයන් මධ්‍යගත කොට ඇත. දේපොළ අල්ප සංඛ්‍යාවක් අත සංකේන්ද්‍රණය කොට ඇත. මෙයින් අවශ්‍යයෙන්ම ඇතිවූ විපාකය වූයේ දේශපාලනමය මධ්‍යගත වීමකි. ස්වාධීන නමුදු ලිහිල් ලෙස එකිනෙකට සම්බන්ධව තිබූ, විභේදකාරී වුවමනාවන්, විවිධ නීති පද්ධති, ආණ්ඩු සහ අයබදු ක්‍රම තිබුණු පෙදෙස්, එකම ආණ්ඩුවක්, එකම නීති සංග්‍රහයක්, එකම ජාතික පංති වුවමනාවක්, එකම තීරුබදු ක්‍රමයක් සහිත, දේශසීමාවක් සහිත ඒකීය ජාතියක් ලෙස ඒකරාශී විය.

ධනපති පංතිය සිය වසරකටත් වඩා අඩු සිය පාලන කාලය තුළදී ඉන් පෙර පැවති සියලු පරම්පරාවන් විසින් ඉදිකරන ලද නිෂ්පාදන බලවේගයන්ගේ සමස්තයට වඩා අති විශාල වූද අති දැවැන්ත වූද නිෂ්පාදන බලවේගයක් බිහි කළේය. සොබාදහම මෙල්ලකිරීම, යන්ත්‍ර නිෂ්පාදනය, කර්මාන්තයට හා කෘෂිකර්මයට රසායනය යෙදවීම, ධූම නෞකා සේවය ආරම්භ කිරීම, දුම්රිය සේවය, විදුලි පණිවුඩ ක්‍රමය, වගාව සඳහා මහද්වීප හෙළිකිරීම, ගංගා වාරිමාර්ගකරණයට යටකිරීම, බහු ජනගහණයන් පොළවෙන් මවා පෑම වැනිදේ ආදී මේ මහා නිෂ්පාදන බලවේගයන් සාමාජීය ශ්‍රමයේ උකුළෙහි සැතපුන බවට පෙර නිමිත්තක් තිබුණේ මින් පෙර කිනම් සියවසරටද!

ධනපති පංතියේ ඉදිකිරීමට පදනම වූ නිෂ්පාදන මාධ්‍යයන් සහ හුවමාරු ක්‍රම නිර්මාණය කරන ලද්දේ රදළ සමාජ ක්‍රමය තුළදී බැව්, එනයින් දැන් අපි දුටිමු. මේ නිෂ්පාදන මාධ්‍ය වල හා හුවමාරු ක්‍රමවල සංවර්ධනයේ එක්තරා අවධියකදී රදළ සමාජය සිය නිෂ්පාදනය සහ හුවමාරුව කළේ යම් තත්ත්වයන් යටතේද, එම තත්ත්වයනුත් කෘෂිකර්මය සහ කුඩා පරිමාණ කර්මාන්ත පිළිබඳ රදළවාදී සංවිධානයත්, එක් වචනයකින් කියතොත් දේපොළ පිළිබඳ රදළවාදි සබඳතාවයන්, ඒ කාලය වන විට සංවර්ධනය වී තිබුණු නිෂ්පාදන බලවේගයන්ට තවදුරටත් අනුරූපී නොවීය. නිෂ්පාදනය දියුණු කරනවා වෙනුවට ඒවාට බාධා කරන්නට විය. ඒවා විලංගු බවට පත් විය. ඒවා පුපුරවා දැමීම අවශ්‍ය විය. එලෙසම ඒවා පුපුරවා දමන ලදි.

නිදහස් තරගය ඊට අනුකූල වන පරිදි සකස් කරගත් සමාජීය හා දේශපාලනමය සංස්ථාපනයක්ද ධනපති පංතියේ ආර්ථික සහ දේශපාලනමය ආධිපත්‍යයද සහිතව ඒවාට අයත් ස්ථානය ගත්තේය.

අප ඉදිරියේ එබඳු ව්‍යාපාරයක් සම්පූර්ණ වෙමින් පවතී. නිෂ්පාදන සහ හුවමාරු සබඳතාවයන් සහිත, දේපොළ අයිතිය පිළිබඳ සබඳතාවයන් සහිත සමකාලීන ධනවාදී සමාජය, මෙතරම් බලසම්පන්න නිෂ්පාදන මාධ්‍යයන් සහ හුවමාරු ක්‍රම මවා තිබෙන මෙම සමාජය, තමා විසින් සිය විජ්ජාකාරි බලයෙන් ආරාධනා කොට ඇති පාතාල ලෝකයේ භූත බලවේගයක් තවදුරටත් මෙල්ල කළ නොහැකි විජ්ජාකාරයකුගේ තත්ත්වයකට වැටී සිටියි. ඉකුත් දසකයන් කීපයක් තිස්සේම කර්මාන්තයේ සහ වාණිජයේ ඉතිහාසය නම්, අන් කිසිවක් නොව, සමකාලීන නිෂ්පාදන තත්ත්වයන්ට විරුද්ධව ධනපති පංතියේ සහ ආධිපත්‍යයේ පැවැත්මට අවශ්‍ය තත්ත්වයන් වන දේපළ සබඳතාවයනට විරුද්ධව සම කාලීන නිෂ්පාදන බලවේගයන් ගෙනයන කැරැල්ලේ ඉතිහාසයයි. කලින් කල, යළි යළිත් ආපසු පැමිණෙන එලෙෂ ආපසු පැමිණෙන හැම වාරයකදීම වඩ වඩාත් තර්ජනාත්මක ලෙස මුළු මහත් ධනපති සමාජයේ පැවැත්මට තර්ජනය කරන වාණිජ අර්බුද ගැන සඳහන් කිරීම ප්‍රමාණවත්ය. මෙම වාණිජ අර්බුද වලදී නිෂ්පාදනය කර තිබූ භාණ්ඩ වලින් සෑහෙන කොටසක් පමණක් නොව නිෂ්පාදන බලවේගයන්ගේද සෑහෙන කොටසක් පවා සෑම වාරයකදීම විනාශකර දමනු ලැබේ. මෙම අර්බුද වලදී ඊට කලින් හැම වකවානුවකදීම අමන ක්‍රියාවක් සේ පෙනී යා හැකි සමාජීය වසංගතයක් අධි නිෂ්පාදනය නැමති වසංගතය දසත පැතිර යයි. හිටිහැටියේ සමාජය ම්ලේච්ඡත්වය කරා ආපසු ඇද වැටුණු සැටියක් දැනෙයි. දුර්භික්ෂයක්, සමස්ත ලෝක විනාශකාරී යුද්ධයක් විසින් ජීවත් වීමේ මාධ්‍යයන් සියල්ල කපා දැමූ කලෙක මෙන් සමාජයට දැනෙයි. කර්මාන්තය සහ වෙළදාම විනාශ වූවක් සේ දැනෙයි. කුමක් නිසාද? වුවමනාවට වඩා වැඩි ශිෂ්ඨත්වයක් සමාජයට ඇති නිසාය, අවශ්‍යතාවයට වඩා වැඩි ප්‍රමාණයක් ජීවන මාධ්‍යයන් තිබෙන නිසාය, වුවමනාවට වඩා වැඩි කර්මාන්තයක් සහ වාණිජයක් සමාජය සතු නිසාය. සමාජයට රිසි පරිදි පාවිච්චි කළ හැකි නිෂ්පාදන බලවේගයන් ධනපති දේපොළ අයිතියේ සබඳතාවයන් වර්ධනය කිරීමට තවත් දුර ඉඩ නොදෙයි. එහෙත් ඒ

වෙනුවට, නිෂ්පාදන බලවේග දේපල සබඳතාවයන්ට වඩා ඉමහත් ලෙස බලවත් වේ. ධනවාදී සබඳතාවයන් ඒවායේ සංවර්ධනයට බාදා කරයි. මේ බාදා මැඩ නැගී සිටීමට නිෂ්පාදන බලවේග ඉදිරිපත් වූ විට, ඒවා මුළු මහත් ධනවාදී සමාජයම ව්‍යාකූලත්වයකට ඇද දමයි. ධනවාදී දේපොළ අයිතියේ පැවැත්ම තර්ජනයට ලක්කරයි. ධනේශ්වර සමාජයේ සබඳතාවයන් විසින් නිපදවන ලද ධන සම්භාරය අඩංගුකර තැබීමට ප්‍රමාණවත් නොවන තරමින් එය පටුවිය. ධනපති පංතිය මේ අර්බුදයන්ගෙන් ගොඩ එන්නේ කෙසේද? එක් අතකින් බලකිරීම නිසා නිෂ්පාදන බලවේගයන්ගේ ඉමහත් තොගයක් විනාශකර දැමීමෙනි. අනිත් අතින්, අලුත් වෙළඳපොලවල් අල්ලා ගැනීමෙන් සහ පැරණි වෙළඳ පොළවල් එහෙම පිටින්ට සූරාකෑමෙනි. එය කරන්නේ කෙසේද? වඩාත් විස්තීර්ණ වූද, වඩාත් විනාශකාරී වූද අර්බුදවලට මග හෙළිකිරීමෙන් සහ අර්බුද වලක්වාලන මාධ්‍යයන් අඩුකරලීමෙනි.

රදළ ක්‍රමය මුළින් උපුටා දැමීමට ධනපති පංතිය පාවිච්චි කළ අවි, දැන් ධනපති පංතියට එරෙහිව එල්ල වීමට පටන් ගෙන ඇත.

තමනට මරණය ළගා කරන අවි ධනපති පංතිය නිපදවූවා පමණක් නොව, මෙම අවි තමනට විරුද්ධව එල්ල කරන මිනිසුන්ද, එනම් සමකාලීන කම්කරුවන්, නිර්ධනීන් බිහි කළේය.

ධනපති පංතිය, එනම් ප්‍රාග්ධනය වැඩෙන්නේ යම් ප්‍රමාණයකටද, එම ප්‍රමාණය සරිලන සේ සමානුපාතිකව නිර්ධන පංතිය, නූතන කම්කරු පංතිය වර්ධනය වේ. මෙම පංතිය තමන්ට වැඩ සොයාගත හැකිතාක් කල් පමණක් පවතී, එයට වැඩ ලැබෙන්නේද, එය සිය ශ්‍රමයෙන් ප්‍රාග්ධනය වැඩිකරන තාක් කල් පමණකි තමන් එක එකා වශයෙන් වෙන්, වෙන්ව විකුණා ගත යුතු මේ කම්කරුවෝ, වෙළදාමට තබා ඇති අන් හැම භාණ්ඩයක් මෙන්ම, වෙළඳ භාණ්ඩයක් වන්නාහ. මෙහි විපාකයක් වශයෙන් ඔවුහු තරගයේ සියලු ජය පරාජයන්ටද, සියලු උච්ඡාවචනයටද ගොදුරු වෙති.

යන්ත්‍ර සූත්‍ර විස්තීර්ණ ලෙස වැඩි වැඩියෙන් පාවිච්චි කිරීම නිසාත්, ශ්‍රම විභජනය නිසාත්, නිර්ධනීන්ගේ ශ්‍රමයෙහි පෞද්ගලික ස්වාධීන ස්වරූපය අතුරුදහන් විය. ඒ අනුව, වැඩකරන්නාට තිබූ වශීකරණත්වයද නැති විය. ඔහු යන්ත්‍රයේ සරළ උපාංගයක් බවට පත්විය. ඔහුගෙන් ඉල්ලා සිටින්නේ ඉතා සරළවූද, අතිශයින්ම ඒකතානමය වූද, ඉතා ලෙහෙසියෙන් ලබාගත හැකිවූද ක්‍රියාකාරිත්වයක් පමණකි. කම්කරුවකුගේ නිෂ්පාදන වියදම සම්පූර්ණයෙන්ම පාහේ, ඔහුගේ ජීවන යැපුම් මාධ්‍යයන් සඳහාත්, ඔහුගේ වර්ගය බෝ කිරීම සඳහාත් සීමා වෙයි. එහෙත් භාණ්ඩයක මිළත්, එම නිසාම ශ්‍රමයේ මිළත් එය නිපදවීමට යන වියදමට සමාන වෙයි. එබැවින් වැඩක ඇති විකර්ශනයට සමානුපාතිකව, වැටුප් අඩු වෙයි. එපමණක්ද නොවේ, යන්ත්‍ර සූත්‍ර පාවිච්චිය සහ ශ්‍රම විභජනය වැඩිවන ප්‍රමාණයට සමානුපාතිකව, වැඩ කරන පැය ගණන වැඩි කිරීමෙන් හෝ එක්තරා පැය ගණනක් තුළදී වැය කරන ශ්‍රමය වැඩි කිරීමෙන් හෝ එක්තරා පැය ගණනක් තුළදී වැය කරන ශ්‍රමය වැඩි කිරීමෙන් හෝ යන්ත්‍ර සූත්‍රවල වේගය වැඩිකිරීමෙන් ආදියෙන් හෝ ශ්‍රම ප්‍රමාණය වැඩි වෙයි.

සමකාලීන කර්මාන්තය, පීතෘ මූලික ශිල්පියාගේ කුඩා වැඩපොල කාර්මික ධනපතියාගේ මහා කම්හල බවට පරිවර්තනය කළේය. කම්හලට එක්රැස් වූ කම්කරුවන් සෙබලුන් ලෙස සංවිධානය කරන ලදි. කාර්මික සේවාවේ සාමාන්‍ය සෙබලුන් ලෙෂ ඔවුන් උසස් නිලධාරීන්ගේ සහ සාජන්ට් වරුන්ගේ අණ දීම යටතේ ඉතා සම්පූර්ණ ධූරාවලියකට යටත්කොට ඇත. ඔවුහු ධනපති පංතියේ සහ ධනපති ආණ්ඩුවේ වහලුන් පමණක් නොවෙත්. ඔවුහු දිනපතාමත්, පැයක් පාසාමත්, යන්ත්‍රයේත්, පාලකයාගේ සහ අන් හැමටම වඩා පෞද්ගලික ධනවාදී නිෂ්පාදකයාගේත් වහලුන් බවට පත්වෙති. තම අවසාන සහ එකම පරමාර්ථය ලාභය ලබාගැනීම බව මෙම දුෂ්ඨ ඒකාධිපතිත්වය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන තරමට, එය වඩාත් නීච, වෛර සහගත, වඩාත් කෲර දෙපක් බවට පත්වේ.

කායික භ්‍රමය සඳහා අවශ්‍ය වන නිපුණත්වය සහ කායික ශක්තිය අඩුවන තරමට, වෙනත් වචන වලින් කියතොත්, නූතන කර්මාන්තය සංවර්ධනය වන තරමට පුරුෂයින්ගේ ශ්‍රමයේ ස්ථානය ළමා සහ ස්ත්‍රී ශ්‍රමය විසින් දරනු ලැබේ කම්කරු පංතියට, වයස් භේදය සහ ස්ත්‍රී පුරුෂ භේදය විශේෂ සාමාජීය වටිනාකම තව දුරටත් බලනොපායි. ඔවුහ් සියලු දෙනාම, වයස හා ලිංගික භේදය අනුව අඩු හෝ වැඩි වියදමින් පාවිච්චි කරනු ලබන ශ්‍රම උපකරණ බවට පත්වෙති.

කම්කරුවා කර්මාන්ත හිමියා විසින් සූරාකෑම අවසන්වීම සහ ඔහුට වැටුප් ලැබෙනවාත් සමගම, ධනහිමි පංතියේ අනෙකුත් කොටස් වන ගෙවල් හිමියාද, කඩකාරයාද, පොළීකාරයාද ආදීහු ඔහුමත කඩා පනිති.

මධ්‍යම පංතියේ පහළ තට්ටු වන කුඩා කර්මාන්ත හිමියෝද, සුළු වෙළෙන්දෝද, සුළු පොලීකරුවෝද, හස්තකර්මාන්ත කරුවෝ සහ ගොවියෝද යන මේ කොටස් නිර්ධන පංතිය දක්වා පහතවැටෙති අඩ වශයෙන් මෙසේ වීමට එක් හේතුවක්නම් විශාල කම්හලක් පටන් ගැනීමට තරම් ඔවුන්ගේ කුඩා ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීමය, එමෙන්ම ඔවුන් විශාල ධනපතීන් සමග කරන තරගයේදී පරාජයට පත්වීමය. අනික් හේතුවනම්, නවීනතම නිෂ්පාදන ක්‍රමවිධි ඔවුන්ගේ ශිල්පමය දක්ෂතාවය නොවටනා දෙයක් බවට පත්කරනු ලැබීමය. මේ ලෙස ජනගහනයේ සියලු පංතීන්ගෙන් නිර්ධන පංතියට පුද්ගලයින් බඳවාගනු ලැබේ.

සංවර්ධනයේ විවිධ අවධි තුළින් නිර්ධන පංතිය ගමන්කරයි. තම උපතත් සමගම නිර්ධන පංතිය, ධනපති පංතියට විරුද්ධව අරගලය ආරම්භ කරයි.

ආරම්භයේදී මෙම අරගලය පටන්ගන්නේ තනි තනි කම්කරුවන් විසිනි. ඉන් ඉක්බිතිව එක් කම්හලක කම්කරුවන් විසින්ද, අනතුරුව එක් වෘත්තියක කම්කරුවන් විසින් එක් පෙදෙසක තමන්ව කෙලින්ම සූරාකන ධනපතියකුට විරුද්ධව අරගලය ගෙනයනු ලැබේ. ඔවුහු සිය ප්‍රහාරය නිෂ්පාදනයේ ධනවාදී සබඳතාවයන්ට විරුද්ධව පමණක් නොව, නිෂ්පාදන උපකරණවලට විරුද්ධවද එල්ල කරති. ඔවුහු තම ශ්‍රමය සමග තරග කරන ආනයනිත භාණ්ඩ විනාශකරති, යන්ත්‍ර සූත්‍ර කඩාබිඳ දමති, කම්හල් ගිනිබත් කරති. මධ්‍ය කාලීන යුග වලදී කම්කරුවාට තිබුණු, නැතිවී ගිය තත්ත්වය, බලහත්කාරයෙන් යළි ලබා ගැනීමට ඔවුහු වැර දරති.

මෙම අවධියේදී, කම්කරුවෝ තවමත් මුළු මහත් රටපුරා පැතිර පවතින අසංසක්ත බලවෙගයත් වන අතර, තරගය නිසා කැඩී වෙන්වී සිටිති කම්කරු බහු ජනතාවගේ ඒකරාශිවීම තවමත් ඔවුන්ගේ ස්වයං සමගියේ ප්‍රතිඵලයක් නොවන අතර එය ධනපතීන්ගේ සමගියේ ඵලයක් පමණකි. ධනපති පංතියට සිය දේශපාලනමය අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිසා එයට මුළු මහත් නිර්ධන පංතියම ක්‍රියාවේ යෙදවීමට සිදුවී ඇත. එපමණක් නොව එයට තව කලකට එසේ කිරීමටද හැකියාවක් ඇත. මේ අවධියේදී නිර්ධනීන් සටන් කරන්නේ තම සතුරන්ට විරුද්ධව නොව, සතුරන්ගේ සතුරන් වන නිරපේක්ෂ රාජාණ්ඩුවේ නටඹුන් වලටත්, ඉඩම් හිමියන්ටත්, කාර්මික නොවන ධනපති පංතියටත්, සුළු ධනපති පංතියටත් විරුද්ධවය. මේ අනුව මුළු මහත් ඓතිහාසික සංවර්ධන ව්‍යාපාරය ධනවාදී පංතිය අත සංකේන්ද්‍රණය වෙයි එවැනි තත්ත්වයන් යටතේ ලබන සෑම ජයග්‍රහණයක්ම, ධනපති පංතියේ ජයග්‍රහණයක් වන්නේය.

එහෙත් කර්මාන්ත සංවර්ධනයත් සමගම නිර්ධන පංතිය සංඛ්‍යාත්මක ලෙස වැඩි වනවා පමණක් නොව, එය වඩාත් විශාල සමූහයන් ලෙස ඒකරාශී වී, සිය ශක්තිය වර්ධනය කරැ ගනී, එමෙන්ම එයට සිය ශක්තිය වැඩි වැඩියෙන් දැනෙයි. යන්ත්‍ර සූත්‍ර මගින් ශ්‍රමයේ සියලු අන්දමේ විශේෂත්වයන් මකා දමන තරමට, හැම තැනකම පාහේ එකම පහත් මට්ටමකට වැටුප් හෙළන තරමට, නිර්ධන පංතියේ විවිධ අවශ්‍යතාවයන් සහ ජීවන තත්ත්වයන් වඩ වඩාත් එකම සමානතාවයකට පත්වේ. ධනපතීන් අතර වැඩිවෙමින් පවතින තරගයත්, එහි විපාකයක් වශයෙන් පැන නගින වාණිජ අර්බුධත් නිසා කම්කරුවන්ගේ වැටුප් වඩාත් අස්ථිර තාවයට භාජනය වෙයි. යන්ත්‍ර සූත්‍ර නොකඩවා දියුණුවන අතර වඩාත් අධික වේගයකින් වර්ධනය වන නිසා නිර්ධන පංතියේ දිවි පෙවෙත වඩ වඩාත් සැක සහිත වෙයි. එක් එක් කම්කරුවන් සහ එක් එක් ධනපතීන් අතර හටගන්නා අරගල එන්ට එන්ටම පංති දෙකක් අතර අරගලයක ස්වරූපය ගනී. කම්කරුවන් ආරම්භ කරන්නේ ධනපති පංතියට විරුද්ධව සභාග (වෘත්තීය සමිති) සෑදීමට පටන් ගැනීමෙනි. වැටුප් ප්‍රමාණය පහත වැටීම වලක්වාලනු පිණිස ඔවුහු එකට එක්වී ක්‍රියා කරති. සිදුවිය හැකි හැප්පීම් වලට සූදානම්වීම සඳහා ඔවුහු ස්ථාවර සංගමයන් පිහිටුවා ගත්හ. තැන් තැන් වල ඇතිවන මේ හැප්පීම් විවෘත ගැටීම් වලට පෙරළෙයි.

කම්කරුවන් ඉඳහිට ජය ගත්තද, එම ජයග්‍රහණය තාවකාලික ඒවා විය. ඔවුන්ගේ සටන් අරගලවල නියම ප්‍රතිඵලය වන්නේ සෘජු ක්ෂණික ජය නොව, වඩාත් පුළුල් ලෙස පැතිරෙන කම්කරු එක්සත්කමය. විශාල කර්මාන්තය විසින් බිහිකරන, විවිධ පෙදෙස්වල කම්කරුවන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධකමක් ඇතිකරන වඩාත් දියුණු වෙන සම්බන්ධ මාර්ග මෙම එක්සත් සංගමයට ආධාර වෙයි. සමාන ස්වරූපයකින් යුත් විවිධ ප්‍රාදේශීය අරගල ඒකීය ජාතික පංති අරගලයක් තුළට මධ්‍යගත කරලීමට අවශ්‍ය වූයේ මේ සම්බන්ධතාවය පමණකි. එහෙත් හැම පංති සටනක්ම දේශපාලන සටනකි. කාලකණ්ණි මහා මාවත් සහිත මධ්‍ය කාලීන යුගවල නාගරිකයින්ට සියවසර කීපයක් තිස්සේ මුදුන්පමුණුවා ගැනීමට නොහැකි වූ මෙම සංගමය සම කාලීන නිර්ධනයෝ දුම්රිය සේවාවන්ට පින්සිදු වන්නට වසර කීපයකින් සපුරාලූහ.

මේ ලෙස පංතියකට නිර්ධනයින් සංවිධානය කිරීමද, ඒ අනුව ඔවුන් දේශපාලන පක්ෂයකට සංවිධානය කිරීමද කම්කරුවන් අතර මොහොතක් පාසා පැන නගින තරගය නිසා විනාශ වේ. එහෙත් මෙම සංවිධානය යලිත් වරක් නැගී සිටින්නේ වඩාත් ශක්තිමත් වෙමිනි, වඩාත් ස්ථිර ලෙසිනි, වඩාත් බල සම්පන්න ලෙසිනි. ධනපතීන්ගේ විවිධ කොටස් අතර ඇතිවන භේද වලින් ප්‍රයෝජනය ගනිමින්, මෙය කම්කරුවන්ගේ තනි ඉල්ලීම් වලට නීත්‍යානුකූල පිළිගැනීමක් දිනාගැනීමට බලකරයි. එංගලන්තයේ දිනකට පැය දහයේ වැඩ පණත සම්මතකරවා ගත්තේ මේ ආකාරයටය.

පොදුවේ පැරණි සමාජයේ අභ්‍යන්තරික ඝට්ටනය බොහෝ අතින් නිර්ධන පංතියේ සංවර්ධනික ක්‍රියාදාමයට හේතු වේ. ධනපති පංතිය ස්ථාවර අරගලයක යෙදී සිටී. ප්‍රථමයෙන් රදළ කුලීනයින්ට විරුද්ධවද, ඉන් ඉක්බිතිව, කර්මාන්ත ප්‍රගමණයට පටහැනි වුවමනාවන් ඇති ධනපති කොටස් වලට විරුද්ධවද, නිත්‍ය වශයෙන්ම සියලු විදේශිය රටවල ධනපතීන්ට විරුද්ධවද ධනපති පංතිය සටන් කරයි. මේ සියළු සංග්‍රාම වලදී නිර්ධන පංතියට ආයාචනා කිරීමටද, එම පංතියේ අධාර ඉල්ලා සිටීමටද, එමගින් එම පංතිය දේශපාලන ව්‍යාපාරයට ඇද ගැනීමටද ධනපති පංතියට සිදුවෙයි. එම නිසා ස්වකීය දේශපාලනමය හා පොදු අධ්‍යාපනය ධනපති පංතිය නිර්ධන පංතියට ලබාදෙයි, එනම්, ධනපති පංතියට විරුද්ධව සටන් කිරීමට නිර්ධනීන්ට අවි ලබා දෙයි.

තවද, අප දැනටමත් දුටු පරිදි, කර්මාන්ත ප්‍රගමනය මගින්, පාලක පංතීන්ගේ කොටස් නිර්ධන පංතියට ඇද දමනු ලැබේ. නැතහොත්, යටත් පිරිසෙයින් ඒවායේ පැවැත්ම අරහයා වූ තත්ත්වයන්ට තර්ජනය එල්ල කෙරේ. මේ කොටස් නිර්ධන පංතියට ප්‍රබුද්ධත්වයේ සහ ප්‍රගතියේ මූලිකාංග සපයති.

අවසානයේදී, පංති සටනේ තීරණාත්මක මොහොත සමීප වන විට, පාලක පංතිය තුළ, මුළු මහත් පැරණි සමාජය තුළ දිරාපත්වීමේ ක්‍රියාදාමය කෙතරම් ප්‍රචණ්ඩ, කෙතරම් තියුණු ස්වරූපයක් ගන්නේදයත්, පාලක පංතියෙන් සුළු කොටසක් කැඩී වෙන්වී, විප්ලවවාදී පංතියට, අනාගතය හිමි පංතියට එකතු වෙයි. මීට කලින්, රදළ කුලීනයින්ගෙන් කොටසක් ධනපති පංතියට ගියාක් මෙන්ම, දැන් ධනපති පංතියෙන් කොටසක් - එනම්, සමස්ථයක් වශයෙන් ඓතිහාසික ක්‍රියාදාමය න්‍යායික ලෙස සාක්ෂාත් කර ගැනීමේ තත්ත්වය දක්වා උසස් වී ඇති ධනපති දෘෂ්ඨි වාදීන්ගෙන් කොටසක් - නිර්ධන පංතිය වෙත පැමිණෙයි.

ධනපති පංතියට විරුද්ධව මුහුණට මුහුණලා නැගී සිටින සියලු පංතීන් අතුරෙන්, නිර්ධන පංතිය පමණක් අද නියම විප්ලවවාදී පංතිය වේ. නවීන මහා කර්මාන්තයේ සංවර්ධනය නිසා ඉතිරි සියලු පංතීහු දිරාපත්වීමකට හසුව අවසානයේදී විනාශවී යති. නිර්ධන පංතිය එහි ස්වකීයම වූත්, අවශ්‍ය වූත් ඵලය වේ.

මැද පංතීන්ගේ කොටස්: කුඩා කර්මාන්ත හිමියා, සුළු වෙළෙන්දා, හස්ත කර්මාන්ත ශිල්පියා, ගොවියා ආදීහු මැද පංතියේ කොටස් වශයෙන් සිය විනාශය වලක්වාලනු පිණිස ධනපති පංතියට විරුද්ධව සටන් කරති. මේ හේතුව නිසා ඔවුහු විප්ලවවාදීන් නොව ගතානුගතිකයින් වන්නාහ. එපමණක් නොව ඔවුහු ප්‍රතිගාමියෝය. ඉතිහාසයේ ඉදිරිගමන නැමති රෝදය ආපසු කරකැවීමට ඔවුහු මහන්සි දරති.

ඔවුන් විප්ලවවාදී වෙති නම්, එයට හේතුව ඔවුන්ට නොබෝ දිනකින්ම නිර්ධන පංතියට ඇතුලුවීමට සිදුවී ඇති බැවිනි. ඔවුන් ආරක්ෂා කරන්නේ ඔවුන්ගේ අද්‍යතන වුවමනාවන් නොව, අනාගත වුවමනාවන්ය. ඔවුන් එසේ කරන්නේ, තම ස්ථාවරය අතහැර නිර්ධන පංතික ස්ථාවරය ගැනීම පිණිසය.

''පාදඩ නිර්ධන පංතිය[29]'' හෙවත් සමාජීය කුණුකන්දල්, නැතිනම් පැරණි සමාජයේ පහල තට්ටුව විසින් ඉවතට දමන ලද අකර්මණ්‍ය ලෙස කුණුවෙමින් පවතින කොටස එක් හෝ තවත් තැනක නිර්ධන පංතික විප්ලවයකින් ව්‍යාපාරය තුළට ඇදී ඒමට ඉඩ ඇත. කෙසේ වුවද ජීවන තත්වයන් අනුව, ප්‍රතිගාමී කුමන්ත්‍රණ වලදී මේ කොටස් අල්ලස් වලට යටවී ක්‍රියා කරන අවි බවට පත්වීමේ නැඹුරුව බෙහෙවින් බලපායි.

පැරණි සමාජයේ තත්වයන්, නිර්ධන පංතික ජීවන තත්වයන් යටතේ සම්පූර්ණයෙන්ම ගිලී යයි. නිර්ධනයාට දේපළ නැත. ඔහු සහ ඔහුගේ පවුලද, දූ දරුවන්ද අතර ඇති සබඳතාවයන් හා ධනවාදී පවුල් සබඳතාවයන් අතර තවදුරටත් කිසිදු පොදු බවක් නැත. ප්‍රංශයේ මෙන්ම එංගලන්තයේද, ජර්මනියේ මෙන්ම ඇමරිකාවේද එක සමාන වූ සමකාලීන කර්මාන්තමය ශ්‍රමයට, සමකාලීන ප්‍රාග්ධනයට යටත්වීම නිසා ඔහුගේ හැම ජාතික ලක්ෂනයක්ම අකාමකා දමා ඇත. නීතිය, සදාචාරය, ආගම ආදිය ඔහුට අන් කිසිවක් නොව, ධනවාදී ප්‍රාග් විනිශ්චයන් පමණකි. මේවා ධනපති අයිතිය වසන් කරන කඩතුරාවන්ය.

මීට පෙර පංති, ආදිපත්‍ය ලබාගත් පසු, ඒවා විසින් ඒ වන විට ලබාගත් තත්වය තහවුරු කර ගැනීම සඳහා, ඒවා විසින් අයත් කර ගත් කොන්දේසි වලට මුළු මහත් සමාජයම පරාදීන කිරීම මගින් තහවුරු කරලීමට පරිශ්‍රම දැරූහ. තම පූර්ව අයත් කර ගැනීමේ ක්‍රමය විනාශ කරමින්, එමගින් ඊට පෙර පැවති අයත් කර ගැනීමේ සියළු ක්‍රම විනාශ කරමින් පමණක් නිර්ධනීන්ට සමාජය නිෂ්පාදනය අයත් කර ගත හැකි වන්නේය. නිර්ධන පංතියට රැකගැනීමට හෝ ආරක්ෂා කර ගැනීමට හෝ කිසිවක් නොමැත. මෙතෙක් පෞද්ගලික දේපල රැකවල් කිරීම සහ රක්ෂණය කිරීම කළ හැම දෙයක්ම විනාශ කර ලීම ඔවුන්ගේ දූත මෙහෙය වන්නේය.

මෙතෙක් පැවති ඓතිහාසික ව්‍යාපාර සියල්ලම අල්පතරයේ ව්‍යාපාර නැතහොත්, අල්පතරයේ උවමනාවන් සඳහා වූ ව්‍යාපාර වේ. නිර්ධන පංතික ව්‍යාපාරය, අති බහුතරයේ උවමනාවන් සඳහා වූ අති බහුතරයේ ස්වාධීන ව්‍යාපාරයයි. සමකාලීන සමාජයේ පහලම තට්ටුව වන නිර්ධන පංතියට, තමන් පිට නැගී සිටින නිල සමාජයෙන් සමන්විත වූ උඩු ව්‍යුහය සී සී කඩ යන සේ වීසි නොකර, නැගිට සිටීමටවත් සෘජු ලෙස කොන්ද කෙලින් කිරීමටවත් නොපුළුවන.

නිර්ධන පංතිය ධනපති පංතියට විරුද්ධව කරන අරගලය හරය අනුව නොවේ නම්, රූපානුකූලව නම්, මුලදී ජාතික අරගලයකි. හැම රටකම ධනපති පංතිය ප්‍රථම කොටම ස්වකීය ධනපති පංතිය සමග ගනුදෙනු බේරා අවසන් කළ යුතුය.

නිර්ධන පංතියේ සංවර්ධනය අරහයා වූ ඉතා හොඳ අවධි විස්තර කිරීමේදී, දැනට පවතින සමාජය තුළ අඩුවැඩි වශයෙන් ආවරණය වූ රටවැසි සිවිල් යුද්ධය, විවෘත විප්ලවයක් බවට පෙරලෙන අවස්ථාවක් දක්වා, ධනපති පංතිය ප්‍රචණ්ඩ ලෙස බලයෙන් පහ කර දැමීමෙන් නිර්ධන පංතියේ ආධිපත්‍යය සඳහා පදනම් දැමීම දක්වා අපි සටහන් කළෙමු.

අප දැනටමත් දැක තිබෙන පරිදි, මෙතෙක් හැම සමාජක්‍රමයක්ම පදනම් වී තිබෙන්නේ පීඩක සහ පීඩිත පංතීන් අතර වූ ප්‍රතිවිරෝධතාවයන් අතරයි එහෙත් කිසියම් පංතියක් පාගාගෙන සිටීමට නම් එම පංතියට යටත් පිරිසෙන්, තම වහල් ජීවිතය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වන තත්වයන් පීඩක පංතිය විසින් සහතික කළ යුතුය. ප්‍රවේනිදාස ක්‍රමය පැවති කාලයේදී, ප්‍රවේනිදාසයා නාගරික සමාජයේ - කොමියුනයේ සමාජිකයා දක්වා ඉහල නැග්ගේය. එලෙසම රදල පරමවාදයේ වියගසට

යටත් වී සිටි සුළු ධනපතියා ධනපතියා දක්වා දියුණු වීමට සමත් විය. එහෙත් එයට පටහැනිව, සමකාලීන කම්කරුවා කර්මාන්තයේ ප්‍රගමනයන් සමග ඉහල නොයයි. තම පංතියේ පැවැත්මේ තත්වයන්ටත් වඩා පහලට ඇද වැටෙයි. ඔහු අන්ත දිළිඳු බවට පත් වෙයි. දරිද්‍රතාවය ජනගහනයටත්, ධනයටත් වඩා සීඝ්‍ර ලෙස වර්ධනය වෙයි. සමාජ ආධිපත්‍යය උසුලන පංතිය වශයෙන් තවදුරටත් පැවතීමටත්, තම පංතියේ පැවැත්මට අදාල වූ තත්වයන් මුළු මහත් සමාජය මත සියල්ල මැඩ පවත්වන අනුක්‍රමික නීතියක් ලෙස පැනවීමටත් ධනපති පංතියට නොහැකි බව ඉතා පැහැදිලි ලෙස පෙනේ. ධනපති පංතියේ පාලනයට සුදුසු නොවන්නේ සිය වහලාට ඔවුන්ගේ වහල් තත්වය යටතේවත් ජීවත් වීමේ තත්වයන් සහතික කිරීමට එය අපොහොසත් වන බැවිනි. ඔවුන්ගෙන් යැපෙනවා වෙනුවට, ඔහුට යැපීමට සිදුවන තත්වයකට ඔහු පත්වීම වලක්වාලීමට එයට නොහැකි බැවින් සමාජයට තවදුරටත් ධනපති පංතිය යටතේ ජීවත් විය නොහැකිය, එනම් එහි පැවැත්ම සමාජයට තවදුරටත් නොගැලපේ.

ධනපති පංතියේ පැවැත්මට සහ එහි ආධිපත්‍යට අවශ්‍ය කොන්දේසිය නම්, පුද්ගලයන් කීප දෙනෙකු අතර ධනය සමුච්චය වීමත් ප්‍රාග්ධනය සම්පාදන වීම සහ එහ වැඩිවීමත් ය. ප්‍රාග්ධනය පැවැත්මේ කොන්දේසිය නම් වැටුප් ශ්‍රමයය. වැටුප් ශ්‍රමය මුළුමනින්ම රඳාපවතින්නේ කම්කරුවන් අතර පවතින තරගය මතය. ධනපති පංතිය විසින් අනිච්ඡානුගතව වර්ධනය කරන කර්මාන්තයේ ප්‍රගමනය කම්කරුවන් අතර තරගයෙන් පැන නගින අසමගිය, වෙනුවට ඔවුන්ගේ සමගි සන්ධානයෙන් පැනනගින විප්ලවීය සමගියක් ඇතිකරලයි. එබැවින් සමකාලීන මහා කර්මාන්තයේ සංවර්ධනය ධනපති පංතිය නිෂපාදනය කරන නිෂ්පාදිත භාණ්ඩ අයත් කර ගැනීමේ පදනම වී ඇති අත්තිවාරම එහි මුලින්ම හාරා දමයි. එබාවින් ධනපති පංතිය අන් හැම දේටම වැඩියෙන් නිපදවන්නේ තම මිනීවලවල් හාරන්නන්ය. ධනපති පංතියේ වැටීමටත්, නිර්ධන පංතියේ ජයග්‍රහණයත් එකසේ නොවැලැක්විය හැකිය.

# II. නිර්ධනයෝ සහ කොමියුනිස්ට්වාදියෝ

කොමියුනිස්ට්වාදීන් සහ පොදුවේ නිර්ධන පංතිය අතර ඇති සබඳතාවය කුමක්ද ?

කොමියුනිස්ට්වාදිහු වෙනත් කම්කරු පංතික පක්ෂවලට විරුද්ධව දේශපාලන පක්ෂ නොසාදති.

සමස්තයක් වශයෙන් නිර්ධන පංතියේම වුවමනාවන් හැර ඒවාට වෙනස් වූත්, ඒවායින් පරිබාහිර වූත් වෙනත් කිසිදු වුවමනාවන් කොමියුනිස්ට්වාදීන්ට නොමැත.

නිර්ධන පංතික ව්‍යාපාරය හැඩ ගස්වා වාත්තු කිරීම සඳහා කොමියුනිස්ට්වාදියෝ තමන්ගේම නිකායවාදී මූලධර්ම කිසිවක් ඇති නොකරති.

කොමියුනිස්ට්වාදීන් අනිකුත් නිර්ධන පංතික පක්ෂ වලින් වෙන්වී පෙනෙන්නේ මේ කරුණු වලින් පමණකි. එක් අතකින් කොමියුනිස්ට්වරු විවිධ රටවල නිර්ධනීන්ගේ අරගල වලදී, ජාතිය කුමක් වුවද, එයට ස්වාධීනව පවතින මුළු මහත් නිර්ධන පංතියේම පොදු වුවමනාවන් වෙන්කොට පෙන්වමින් ඒවා පෙරමුණට ගෙන එති. අනිත් අතින්, ධනපති පංතියට විරුද්ධව ඇති කම්කරු පංති සටන් අරගල ගමන් ගන්නා වූ විවිධ සංවර්ධන අවධි වලදී කොමියුනිස්ට්වරු සෑම විටමත්, සෑම තැනකදීමත් සමස්තයක් වශයෙන් මුළු ව්‍යාපාරයේ වුවමනාවන් නියෝජනය කරන්නෝ වෙති.

මෙම හේතුව නිසා කොමියුනිස්ට්වාදීන් ව්‍යවහාරික වශයෙන් හැම රටකම කම්කරු පංති පක්ෂවල ඉතා අධිෂ්ඨාන සහගත සහ ඉදිරි ගමනට ආස්වාදය ලබා දෙන පුරෝගාමී කොටස වේ. න්‍යායික වශයෙන් ඔවුනට නිර්ධන පංතික ව්‍යාපාරයේ තත්වය, ගමන් මාර්ගය හා පොදු ප්‍රතිඵල ගැන පැහැදිලි අවබෝධයක් ඇති බැවින් ඔවුනට නිර්ධන පංතියේ සෙසු බහු ජනතාවට නැති වාසියක් ඇත්තේය.

කොමියුනිස්ට්වාදීන්ගේ ක්ෂණික අරමුණ, අන් සියළු නිර්ධන පංතික පක්ෂ වල ක්ෂණික අරමුණමය. එනම්, පංතියක් වශයෙන් නිර්ධනීන් සංවිධානය කිරීමය, ධනවාදී ආධිපත්‍යය මුලිනුපුටා දමා, නිර්ධන පංතියට දේශපාලන බලය ලබා දීමය.

විශ්ව සමාජ ප්‍රතිසංස්කාරකයකු ලෙෂ පෙනී සිටීමට තැත් කරන එක් හෝ තවත් පුද්ගලයෙකු විසින් නිපදවන ලද, නැතිනම් සොයා ගන්නා ලද සංකල්ප හෝ මූලධර්ම මත කොමියුනිස්ට්වාදීන්ගේ න්‍යායික නිගමනයන් කිසි ලෙසකින්වත් පදනම්වී නැත.

හුදෙක් වාස්තවික ලෙස පවතින පංති අරගලයක් තුලින්, අපේ ඇස් ඉදිරියේම කෙරී ගෙන යන, ඓතිහාසික ක්‍රියාදාමයක් තුලින් පැන නගින සබඳතාවයන් පොදුවේ ප්‍රකාශ කිරීම පමණක් මේ න්‍යායික නිගමනයන් කෙරේ. දැනට පවතින දේපොළ සබඳතාවයන් අහෝසි කර දැමීම කිසිසේත්ම කොමියුනිස්ට්වාදයේ විශේෂ ලක්ෂණයක් නොවේ.

අතීතයේ සියළු දේපොළ සබඳතාවයන් ඓතිහාසික තත්වයන්ගේ වෙනස් වීමේ විපාකයක් වශයෙන් ඓතිහාසික වෙනස් වීම් වලට අවිච්චින්න ලෙසම භාජනය වී ඇත.

ප්‍රංශ විප්ලවය නිදසුනක් වශයෙන්, ධනපති දේපොළ ක්‍රමය ඇති කරලීමෙන්, රදළවාදී දේපොළ ක්‍රමය අහෝසි කලේය.

දේපොළ පොදු වශයෙන් අහෝසි කර දැමීම නොව ධනවාදී දේපොළ ක්‍රමය අවලංගු කර දැමීම කොමියුනිස්ට්වාදයේ විශේෂ ලක්ෂණය වේ.

එහෙත් සමකාලීන ධනවාදී පෞද්ගලික දේපොළ ක්‍රමය, පංති ප්‍රතිවිරෝධතා මත, ටික දෙනෙකු විසින් වැඩි දෙනෙකු සූරා කෑම මත පදනම් වූ නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදිත භාණ්ඩ අයත් කර ගැනීම පිළිබඳව අවසාන වූත් අති පූර්ණවූත් ප්‍රකාශනයයි.

මේ අර්ථයෙන් කොමියුනිස්ට්වාදීන්ගේ න්‍යායයට මෙවැනි අර්ථ කථනයක් දිය හැකිය. එනම්, පෞද්ගලික දේපොළ ක්‍රමය අහෝසි කර දැමීමය.

කොමියුනිස්ට්වාදීන් වන අපට දෝෂාරෝපණයන් එල්ල කොට ඇත්තේ, සියළු පෞද්ගලික නිදහසේ, ක්‍රියාකාරිත්වයේ සහ ස්වාධීනත්වයේ පදනම යැයි කියනු ලබන, මිනිහකුට තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පෞද්ගලික අයිති කර ගත හැකි දේපොළ අයිතිය අහෝසි කර දැමීමේ අභිලාෂයක් අප තුල තිබෙන බැවිනි.

අමාරුවෙන් දිනාගත්, ස්වයං උපාර්ජිත, ස්වයං ශ්‍රමයෙන් ලබාගත් දේපොළ! ඔබ කියන්නේ ධනවාදී දේපොළ ක්‍රමයට පෙර පැවති, කුඩා හස්ත කර්මාන්ත ශිල්පියාගේ සහ කුඩා ගොවියාගේ දේපොළ ගැනද? එම දේපොළ විනාශ කරලීමට අපට කිසිදු වුවමනාවක් නැත. කර්මාන්ත සංවර්ධනය විසින් අති විශාල වශයෙන් මෙය විනාශ කර ඇත. එය දැනටමත් දිනපතා එය විනාශ කරමින් සිටී.

නැතිනම්, ඔබ සමහර විට කතා කරන්නේ සමකාලීන ධනපති පංතියේ දේපොළ ගැනද?

එහෙත් වැටුප් ශ්‍රමය, නිර්ධනයාගේ ශ්‍රමය ඔහුට කිසියම් දේපොළක් නිර්මාණය කරයිද? කොහෙත්ම නැත. එය නිර්මාණය කරන්නේ ප්‍රාග්ධනයයි. එනම්, එය වැටුප් ශ්‍රමය සූරා කන දේපොළ නිර්මාණය කරයි. අළුතින් සූරා කෑම සඳහා අළුත් වැටුප් ශ්‍රම තොගයක් ලබා ගැනීමේ තත්වය යටතේ මිස අන් ලෙසකින් වැඩිවීමට නොහැකි දේපොළයි. වත්මන් ආකාරය සහිත දේපොළ පදනම් වී ඇත්තේ ප්‍රාග්ධනයත්, වැටුප් ශ්‍රමයත් අතර වූ ප්‍රතිවිරෝධීතා මතයි. අපි දැන් මේ ප්‍රතිගතතාවයේ දෙපැත්ත පිරික්සා බලමු.

ධනපතියෙකු වීමට නිෂ්පාදනයෙහි හුදෙක් පෞද්ගලික තත්වයක් පමණක් නොව, සමාජීය තත්ත්වයක්ද අවශ්‍ය වේ. ප්‍රාග්ධනය සාමූහික ඵලයකි. එය නිර්මාණය කොට ක්‍රියා කරවිය හැක්කේ සමාජයේ සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ ක්‍රියාකාරිත්වය තුලින් පමණකි. එපමණක් නොව, අවසානයේදී, සමාජයේ සාමාජිකයින්ගේ එක්සත් ක්‍රියාකාරීත්වය තුලින් පමණකි.

එබැවින් ප්‍රාග්ධනය පෞද්ගලික නොව සමාජ බලයකි.

එම නිසා, ප්‍රාග්ධනය පොදු දේපොළ බවට, සමාජයේ සියළු සාමාජිකයින්ගේ දේපොළ බවට පරිවර්තනය කරන විට එමගින් පෞද්ගලික දේපොළ සාමාජීය දේපොළ බවට පරිවර්තනය නොවෙයි. දේපොළවල සමාජමය ස්වරූපය පමණක් වෙනස් වෙයි එහි. පංති ස්වරූපය නැතිවෙයි.

දැන් අපි වැටුප් ශ්‍රමය ගෙන බලමු.

වැටුප් ශ්‍රමයේ සාමාන්‍ය මිළ නම්, අවමය වැටුපයි, එනම් කම්කරුවා හුදු කම්කරුවකු ලෙස යම්තම් ජීවත් කොට තබා ගැනීමට අවශ්‍ය, නිරපේක්ෂ යැපුම් මාධ්‍යයන්ගේ සමස්තයයි. එබැවින් වැටුප් ශ්‍රමිකයා තම ශ්‍රමය මගින් අයත් කර ගන්නේ තම ජීවිතය දිග්ගැස්සවීමට සහ එය ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවශ්‍ය අවම ප්‍රමාණයක් පමණකි. මේ ආකාරයේ ශ්‍රම ඵලයක් විනාශ කර දැමීමට අප කොහෙත්ම අදහස් නොකරන්නේ, එය මිනිස් ජීවිතය පවත්වාගෙන යාම සඳහාත් මිනිස් ජීවිතය ප්‍රති නිෂ්පාදනය කිරීම සඳහාත් වැය වන අතර එය අනුන්ගේ ශ්‍රමය සූරා කන පාලනයක් ඇති කරන අතිරික්තයක් ඉතිරි නොකරන බැවිනි. අපට විනාශ කිරීමට වුවමනා වී ඇත්තේ මේ අයත් කර ගැනීමේ කාලකණ්ණි ස්වරූපය පමණකි. මේ අයත් කර ගැනීම යටතේ කම්කරුවා ජීවත් වන්නේ හුදෙක් ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහාය. එමෙන්ම පාලක පංතියේ වුවමනාවන්ට අවශ්‍ය වන තෙක් ඔහුට ජීවත් වීමට ඉඩදී ඇත.

ධනපති සමාජය තුල ජීවමාන ශ්‍රමය, සමුච්චගත කරන ලද ශ්‍රමය වැඩි කරලීමේ මාධ්‍යයක් පමණකි. කොමියුනිස්ට්වාදී සමාජයක් තුල සමුච්චගත කරන ලද ශ්‍රමය කම්නරුවාගේ පැවැත්ම පුළුල් කිරීමටත්, එය පොහොසත් කරලීමටත්, පහසු කරීමටත් යොදන මාධ්‍යයක් පමණකි.

ඒ අනුව ධනවාදී සමාජය තුල වර්තමානය මැඩ අතීතය ආධිපත්‍යය උසුලයි. කොමියුනිස්ට්වාදී සමාජය තුල අතීතය මැඩ වර්තමානය ආධිපත්‍යය උසුලනු ඇත. ධනවාදී සමාජය තුල ප්‍රාග්ධනය ස්වාධීනය, පෞද්ගලිකත්වයෙන් යුක්තය, එහෙත් ජීවමාන වැඩ කරන පුද්ගලයා පරාධීනය, පෞද්ගලිකත්වයෙන් තොරය.

මෙවැනි සබඳතාවයන් විනාශ කරලීම ධනපති පංතිය හදුන්වන්නේ පෞද්ගලිකත්වය සහ නිදහස නැති කරලීසක් ලෙසිනි. ඔවුන් නිවැරදිය. අත්ත වශයෙන්ම මෙහිදී අපේ අරමුණ වී තිබෙන්නේ, ධනවාදී පෞද්ගලිකත්වයත්, ධනවාදී නිදහසත්, ධනවදී ස්වාධීනත්වයත් නැති කර ලීමය.

නිෂ්පාදනය පිළිබඳ අද්‍යතන ධනපති තත්වයන් යටතේ නිදහස යනු වෙළඳාමේ නිදහසය, අලෙවි කිරීමේ නිදහසය, මිළදී ගැනීමේ නිදහසය.

එහෙත් අලෙවි කිරීම සහ මිළදී ගැනීම අතුරුදහන් වන්නේ නම්, නිදහස් වෙළදාම සහ නිදහස් මිළදී ගැනීමත් අතුරුදහන් වෙයි. නිදහසේ අලෙවි කිරීම සහ මිළදී ගැනීම අරබයා වූ මේ කතාවේත්, පොදුවේ නිදහස අරබයා වූ අපේ ධනපති පංතියේ අන් සියළු "පම්පෝරි කතා වලත්" කිසියම් තේරුමක් ඇතොත්, ඇත්තේ එම මධ්‍ය කාලීන යුගවල පැවැති ස්වාධීනත්වයෙන් තොරවූ සීමා සහිත අලෙවි කිරීම හා මිළදී ගැනීම සහිතව වහල් තත්වයේ සිටි වෙළෙන්දන් සමඟ සන්සන්දනය කරන විට පමණකි. එහෙත් අලෙවි කිරීම සහ මිළදී ගැනීමත්, නිෂපාදනය කිරීමේ ධනවාදී සබඳතාවයන් සහ ධනපති ක්‍රමයත් විනාශ කරලීමේ කොමියුනිස්ට් ක්‍රමය සමඟ සනසන්දනය කරන විට එහි කිසිදු තේරුමක් නැත.

ඔබ තැතිගෙන සිටින්නේ පෞද්ගලික දේපොළ නැති නර දැමීමේ අපගේ අභිප්‍රාය ගැනය. එහෙත් දැනට පවතින ඔබේ සමාජය තුල දහයෙන් කොටස් නවයකටම පෞද්ගලික දේපොළ දැනටමත් නැති කර දමා ඇත. සමාජයේ දහයෙන් කොටස් නවයකටම පෞද්ගලික දේපොළ නැති හේතුව නිසාම ස්වල්ප දෙනෙකුට එය ඇත්තේය. එබැවින්, සමාජයේ අති බහුතරයට කිසිදු දේපොළක් නොතිබීම, ස්වකීය පැවැත්ම සඳහා අවශ්‍ය තත්වය වශයෙන් පවතින දේපොළ ක්‍රමය නැති කර දැමීමට අප අදහස් කරන නිසා ඔබ අපට දොස් පවරන්නෙහිය.

එක වචනයකින් කියතොත්, ඔබේ දේපොළ නැති කිරීමට අදහස් කිරීම ගැන ඔබ අපට දොස් පවරන්නෙහිය. සත්තකින්ම එසේය. අපි ඇත්තවශයෙන්ම එසේ කිරීමට අදහස් කරමු.

ශ්‍රම ශක්තිය, ප්‍රාග්ධනය, මුදල්, ඉඩම් බදු කුලිය බවට තවදුරටත් පරිවර්තනය කිරීමට නොහැකි, කෙටියෙන් කියතොත්, ඒකාධිකාරී බලයකට නතු කල හැකි සමාජීය බලයට පරිවර්තනය කළ නොහැකි මොහොතේ සිට එනම්, පෞද්ගලික දේපොළ ධනවාදී දේපොළ බවට තවදුරටත් පරිවර්තනය කල නොහැකි මොහොතේ සිට, පෞද්ගලිකත්වය විනාශ වෙතියි ඔබ කියන්නෙහිය.

එබැවින් පුද්ගලයා යනුවෙන් ඔබ අදහස් කරන්නේ ධනපතියා හැර, නැතහොත් ධනවාදී දේපොළ හිමියා හැර අන් කිසිවකු නොවන බව ඔබ නොසඟවා පිලිගත යුතුය. මෙවැනි පුද්ගලයෙකු සැබවින්ම නැති කර දැමිය යුතුය.

කොමියුනිස්ට්වාදය සමාජයේ ඵල අයත් කර ගැනීමේ හැකියාව කිසිවකුගෙන් පැහැර නොගනී. එවැනි අයත් කර ගැනීම් මගින් අනුන්ගේ ශ්‍රමය වහල් කර ගැනීමේ හැකියාව ඔහුගෙන් උදුරා ගැනීම පමණක් එය ඉටු කර ලයි.

පෞද්ගලික දේපොළ අහෝසි කර දැමීමෙන් ඉක්බිතිව, හැම වැඩක්ම නතර වී, සමස්ත ලෝක අලසභාවයක් රජ කරනු ඇතැයිද යනුවෙන් විරුද්ධත්වයක් මතු කොට ඇත.

මෙය සත්‍යයක් නම්, අලස කම නිසා ධනවාදී ලෝකය විනාශවී යා යුතුව තිබුනේ මීට බොහෝ කලකට පෙරය. මන්ද යත්, එම සමාජය තුල වැඩ කරන අය සතුව කිසිවක් නොතිබුණු බැවැනි. සියළු දේපොළ අයත්කර ගෙන සිටින වුන් වැඩ නොකරන බැවිනි. ප්‍රාග්ධනය තවදුවරටත් නොපවතින කල්හි, වැටුප් ශ්‍රමයකටද පැවතිය නොහැකි යැයි කියන විට මුළු මහත් විරුද්ධත්වය අන් කිසිවක් නොව පුනර්වාචකයේ තවත් ප්‍රකාශනයක් පමණකි.

ද්‍රව්‍යමය භාණ්ඩ නිපදවීමේ සහ අයත් කර ගැනීමේ කොමියුනිස්ට්වාදී ආකාරයට එරෙහිව ඉදිරිපත් කරන සියළු විරුද්ධත්වයන් බුද්ධිමය ඵල නිපදවීමේ සහ අයත් කර ගැනීමේ කොමියුනිස්ට්වාදී ආකාර වලට එරෙහිවද එලෙසම ඉදිරිපත් කර ඇත. ධනපති පංතියට අයත් දේපොළ අහෝසි කර දැමීම, මුළුමහත් නිෂ්පාදනයම අහෝසි කර දැමීමක් ලෙස ධනපතියා විසින් ගණන් ගනු ලබන්නේ යම් සේද එසේම ධනපති පංතියට අයත් සංස්කෘතිය අහෝසි කර ලීම, සංස්කෘතිය සමස්තයක් වශයෙන් අහෝසි කරලීමක් සේ ඔහු සලකයි.

නැතිවී යාම නිසා ඔහුගේ දොම්නසට භාජනය වී ඇති ඒ සංස්කෘතිය අති මහත් බහුතරයට  නම්, යන්ත්‍රයක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා දෙනු ලබන පුහුණුවක් පමණකි.

එහෙත් ධනවාදී දේපොල අහෝසි කරලීම මැන බැලීම පිනිස ස්වාධීනත්වය, සංස්කෘතිය සහ නීතිය ආදිය පිළිබඳවූ ඔබේ සංකල්ප යොදන තුරු ඔබ අප සමඟ විවාද නොකරන්න. ඔබගේ නීති සංග්‍රහය, සියළුදේ මත බලපාන නීතියක් දක්වා උසස් කරන ලද ඔබ පංතියේම අභිමතය වන්නාසේම, ඔබේ පංතියේ පැවැත්ම පිළිබදව වූ ද්‍රව්‍යමය තත්වයන් මඟින් තීරණය කරනු ලබන අභිමතයක් වන්නා සේම, ඔබේ සංකල්පද ධනපති නිෂ්පාදන සබඳතාවයන් සහ ධනපති දේපල අයිතිය පිළිබඳ ධනවාදී සබඳතාවයන්ගේ ඵලයවේ.

නිෂ්පාදන සබඳතාවයන් ගෙන්  සහ දේපල පිළිබඳ සබඳ තාවයන්ගෙන් පැන නගින සාමාජීය ස්වරූපයන් නිෂපාදන සංවර්ධන ක්‍රියාදාමයේදී ඇති වී, නැති වී යන ඓතිහාසික සබඳතාවයන් ස්වභාව ධර්මයේ සහ ප්‍රබුද්ධත්වයේ සදාකාලීන නීති බවට පරිවර්තනය කිරීමට ඔබ පොළඹවාලන ඒ ආත්මාර්ථකාමී සාවද්‍ය විකල්පනය ඔබට පමණක් සීමා වූවක් නොව, ඔබට කලින් පැවැති සහ අභාවයට ගිය හැම පාලක පංතියකටම පොදු වූවකි. පෞරාණික දේපොළ පිළිබඳවත්, රදළවාදී දේපොළ පිළිබඳවත් ඔබේ වැටහීම හා ඔබේ පිළිගැනීම ධනවාදී දේපොළ සම්බන්ධයෙන් ඔබ වටහා ගැනීමට කොහෙත්ම පිළිගැනීමට සූදානම් නැත.

පවුල විනාශ කර දැමීම, අති රැඩිකල්වාදී පුද්ගලයා පවා මෙම ඉතා අපකීර්තිමත් අභිප්‍රාය නිසා කෝපාන්විත වෙයි.

සමකාලීන, ධනවාදී පවුල පදනම්වී තිබෙන්නේ කුමන අත්තිවාරමක් මතද? ප්‍රාග්ධනය මතය, පෞද්ගලික ලාභය මතය. සම්පූර්ණ ලෙස වර්ධනය වූ ස්වරූපයකින් මේ පවුල පවතින්නේ ධනපති පංතිය සඳහා පමණකි. එහෙත් මේ තත්වයෙහි අනුපූරකය වී ඇත්තේ නිර්ධනීන් අතර නියම පවුල් ජීවිතයක් නොමැති වීමත් ප්‍රසිද්ධ ගණිකා වෘත්තියක් තිබීමත්ය.

මේ අනුපූරකය අතුරුදහන් වන විට, ධනවාදී පවුලද ස්වභාවයෙන්ම අතුරුදහන් වෙයි. ප්‍රාග්ධනය අතුරුදහන් වීමත් සමඟ මේ දෙකම අතුරුදහන් වන්නේය.

ඔබ අපට චෝදනා කරන්නේ, දරුවන් ස්වකීය දෙමාපියන් විසින් සූරා කෑම නවත්වාලීමට අපට වුවමනා නිසාද? මේ අපරාධයට වැරදිකරුවන් බව අපි පිළිගනිමු.

එහෙත් ගෘහමය අධ්‍යාපනය නැති කර දමා ඒ වෙනුනට සාමාජීය අධ්‍යාපනයක් ඇති කරන විට, මිනිසාට අතිශයින්ම වටනා සබඳකම් අප විනාශ කරතියි ඔබ පවසන්නෙහිය.

ඔබේ අධ්‍යාපනය සාමාජීය නොවන්නේද? නියම හෝ අනියම් හෝ වශයෙන් කෙරෙන සමාජයේ මැදහත් වීම මඟින් පාසල් මාධ්‍යයෙන් ඔබ අධ්‍යාපනය දෙන්නේ යම් සාමාජීය තත්වයන් යටතේද, එම සාමාජීය තත්වයන් මගින් එය තීරණය නොවන්නේද? අධ්‍යාපනය දීමේදී සමාජයේ බලපෑම කොමියුනිස්ට්වාදීන් විසින් මවනු ලැබූ දෙයක් නොවේ. එම අධ්‍යාපනයේ ස්වරූපය පමණක් වෙනස් කිරීම කොමියුනිස්ට්වාදීන්ගේ වෑයම වෙයි. පාලක පංතියේ බලපෑමෙන් අධ්‍යාපනය ගලවා ගැනීම පමණකි.

සමකාලීන මහා පරිමාණ කර්මාන්තයේ සංවර්ධනය මගින් නිර්ධනීන් අතර ඇති සියළු පවුල් සබඳතාවයන් ඉරා දමන තරමට නිර්ධනීන්ගේ දූ දරුවන් සරල වෙළඳ භාණ්ඩ බවට හා ශ්‍රම උපකරණ බවට පරිවර්තනය කරන තරමට, පවුල සහ අධ්‍යාපනය ගැනත් දෙමාපියන් සහ දූ දරුවන් අතර මෘදු සබඳකම් ගැනත් වූ ධනවාදී පංතියේ රැවටිලි සහගත හිස් ප්‍රලාප තවදුරටත් පිළිකුල් සහගත වෙයි.

එහෙත් කොමිනියුස්ට්වාදීන් වන නුඹලා ස්ත්‍රීන් පොදුවේ පාරිභෝග කිරීමකට ඉදිරිපත් වී ඇතැයි ධනපතීහු එකහඬින් බෙරිහන් දෙති.

ධනපතියා සිය බිරිඳ සලකන්නේ ද හුදෙක් නිෂ්පාදන උපකරණයක් ලෙසටය. සියලු නිෂ්පාදන උපකරණ පොදුවේ පාවිච්චි කිරීමට යන බවක් ඔහුට ඇසෙයි. ඒ අනුව ස්වභාවයෙන්ම පොදු පාරිභෝජනයේ ඉරණම එලෙසම ස්ත්‍රීන්ටද බලපාතියි යන අදහස හැර වෙනත් දෙයක් සිතා ගැනීමට හෝ අපොහොසත් වෙයි.

ස්ත්‍රීන් හුදෙක් නිෂ්පාදන උපකරණ පමණක් හැටියට සිතීමේ තත්ත්වයෙන් ඔවුන් මුදවාලීම අපේ අරමුණ යැයි අනුමාන වශයෙන් කල්පනා කිරීමට තරම්වත් ඔහුට ශක්තියක් නැත.

කොමිනියුනිස්ට්වරුන් නිල වශයෙන් පිහිටුවාලීමට යතියි ධනපතීන් කියන ස්ත්‍රීන් පොදුවේ පාරිභෝජනය කිරීමේ ක්‍රමය කෙරෙහි ධනපතීන් දක්වන උසස් අධ්‍යාත්මික කෝපයට වඩා හාස්‍යජනක දෙයක් තවත් නැත. ස්ත්‍රීන් පොදුවේ පාරිභෝජනය කිරීම කොමිනියුස්ට්වරුන්ට අළුතින් ඉදිරිපත් කිරීමට වුවමනාක් නැත. එය අනාදිමත් කාලයක සිට පැවත එන්නකි.

අපේ ධපතියෝ ප්‍රසිද්ධ ගණිකාවන් හැරුණු විට, නිර්ධනීන්ගේ බිරියන් හා දූවරුන් ද තමනට රිසි සේ පාවිච්චි කරති. ඔවුනොවුන්ගේ බිරියන් සමග අනාචරයේ හැසිරෙමින් ඉන් සමහරක් තෘප්තියක් ලබති.

ධනවාදී විවාහය සැබවින්ම පොදු භාර්‍යා ක්‍රමයකි. එබැවින් කොමියුනිස්ට්වාදීන්ට විරුද්ධව ධනපතීන්ට කළ හැකි උපරිමය දෝෂාරෝපනය වන්නේ වංචනික ලෙස සඟවා ඇති පොදු භාර්‍යා ක්‍රමය නිල වශයෙන් විවෘත ලෙස කිරීමට යන්නේය කියායි. වත්මන් නිෂ්පාදන ක්‍රමය අහොසි කර දැමීමත් සමගම ඒ සමාජ ක්‍රමයයෙන් පැන නැගි පොදු භාර්‍යා ක්‍රමයත්, එනම් ප්‍රසිද්ධියේ සහ අප්‍රසිද්ධියේ කැරෙන ගණිකා වෘත්තියත් අහෝසි විය යුතු යැයි මින් ප්‍රත්‍යක්ෂ ලෙසම පැහැදිලි වෙයි.

කොමියුනිස්ට්වාදීන් වෙත එල්ල කරන තවත් දෝෂාරෝපනයක් නම්, රට, ජාතිය අහෝසි කර දැමීමට ඔවුන් ඉදිරිපත් වී සිටින බවය.

වැඩ කරන කම්කරුවන්ට රටක් නැත. ඔවුනට නැති දෙයක් ඔවුන්ගෙන් පැහැර ගත නොහැකිය. නිර්ධන පංතිය ප්‍රථම කොටම, දේශපාලන ආධිපත්‍ය ලබාගත යුතු බැවින්, මත ජාතියෙන් ම සමන්විත විය යුතු බැවින්, එතරම් දුරට එය ජාතික විය යුතුය. එහෙත් ධනවාදී අර්ථය අනුව ජාතික ලෙස නොවේ.

ධනපති පංතියේ වර්ධනයද, නිදහස් වෙළඳාමද, සමස්ත ලෝක වෙළඳ පොළද, කර්මන්ත නිෂ්පාදනයේ ඒකතානමය භාවයද, ඊට අනුරූපී ජීවන තත්තවයන් ද හේතු කොට ගෙන, ජනතාවන් අතර ජාති වෙනස්කම් සහ ප්‍රතිඝතිතයන්ද වඩ වඩාත් අතුරුදහන් වෙමින් පවතී.

නිර්ධන පංතික ආධිපත්‍ය විසින් මේ අතුරුදහන් වීම වඩාත් වේගවත් කරනු ඇත. යටත් පිරිසෙයින් සභ්‍ය රටවල ඒකීය ක්‍රියාකාරිත්වය නිර්ධන පංතියේ විමුක්තිය සඳහා අවශ්‍ය මුල් කොන්දේසිවලින් එකකි.

එක් පුද්ගලයෙක් තවත් පුද්ගලයකු සූරාකෑම අවසන් කර දමන ප්‍රමාණයට සමානුපාතිකව එක් ජාතියක් තවත් ජාතියක් සූරාකෑමද අහෝසිකර දමනු ඇත.

එක් ජාතියක් තුළ පංතීන් අතර ඇති විරෝධය අතුරුදහන් වන ප්‍රමාණයට සමානුපාතිකව ජාතීනී අතර ඇති සතුරු ආකල්පයන්ද අඩුවනු ඇත.

ආගමික, දාර්ශනික සහ දෘෂ්ටිමය ස්ථාවරයන් මත පිහිටා කොමිනියුස්ට් වාදයට විරුද්ධව එල්ල කරන චෝදනා බැරෑරුම් පිරික්සුමට හසු කිරීමට තරම් සුදුසු ඒවා නොවේ.

ජීවන තත්ත්වයන් සමග, එහි සාමාජීය සබඳතාවයන් සමග, සාමාජීය ජීවිතයෙහි ඇති වන හැම වෙනස්වීමක් සමග මිනිසාගේ අදහස්, දෘෂ්ටිය සහ සංකල්පනා, එක වචනයකින් කියතොත්, ඔහුගේ සවිඥානය වෙනස් වන බව වටහා ගැනීමට විශේෂ ගැඹුරු බුද්ධියක් අවශ්‍ය වන්නේද ?

ද්‍රව්‍යමය නිෂ්පාදනය වෙනස් වන තරමට, ඊට සමානුපාතිකව අධ්‍යාත්මික නිෂ්පාදනය වෙනස් වන්නේ යැයි හැරුණු විට, සංකල්ප පිලිබඳ ඉතිහාසය වෙන කුමක් ඔප්පු කරන්නේද? හැම කාලයකටම බලපෑ අදහස් එම කාලයේ පාලක පංතියේ අදහස් විය.

මුළු මහත් සමාජය විප්ලවයට හසු කරන සංකල්පය ගැන පවසති. එයින් අදහස් කරන්නේ අන් කිසිවක් නොව, පැරණි සමාජයක් තුළ අළුත් සමාජයක බීජයක් හටගෙන තිබෙන බවය, ජීවත්වීමේ පැරණි තත්ත්වයන් අභාවයට යන අතර එයත් සමග අත්වැල් බැඳගෙන පැරණි සංකල්පයන් ද අභාවයට යන බවය.

පැරණි ලෝකය විනාශයේ ගැට්ට වෙත ලංවූ විට, පැරණි ආගම් පරදවා ක්‍රිස්තියානි ආගම ජය ගත්තේය. 18 වැනි ශතවර්ෂයේදී ක්‍රිස්තියානි සංකල්ප තාර්කික හේතුවාදී සංකල්පයට යටවී අභාවයට යත්ම, රදළවාදී සමාජය එවකට විප්ලවවාදී වැ සිටි ධනවාදී පංතියට විරුද්ධව මාරක සටනක යෙදුනේය. ආගමික නිදහස සහ හෘදය සාක්ෂියේ නිදහස අරහයා වූ සංකල්ප පිළිබඳව ක්ෂේත්‍රයේ නිදහස් තරඟයේ ආධිපත්‍යය පමණක් ප්‍රකාශ කළේය.

"ඓතිහාසික සංවර්ධන ක්‍රියාදාමයේ දී ආගමික, සදාචාරාත්මක, දාර්ශනික, දේශාපලනමය සහ නීතිමය සංකල්ප විකරණයට භාජනය වූ නමුදු ආගම, සදාචාරය, දර්ශනවාදය, දේශාපාලන විද්‍යාව සහ නීතිය මේ වෙනස් වීමට හසු නොවී ආරක්ෂා වී ඇතැ" යි අපට කියනු ඇත.

"එපමණක් නොව, සමාජ සංවර්ධනයේ සියලු අවධිවලට පොදු වූ නිදහස, සාධාරණත්වය, ආදී සදාකාලික සත්‍යයන්ද ඇත. එහෙත් කොමියුනිස්ට්වාදය සියලු සදාකාලික සත්‍යයන් අවලංගු කරයි. ආගම් සහ සදාචාරයන් නව පදනමක් මත පුනඃස්ථාපනය කරනවා වෙනුවට කොමින්යුස්ට්වාදය ඒවා සියල්ල අවලංගු කරයි. ඒ අනුව එය මෙතෙක් පැවති සියලු ඓතිහාසික ක්‍රියාදාමයේ අත්දැකීම්වලට විරුද්ධය."

මේ චෝදනාවේ තේරුම කුමක්ද? සියලු අතීත සමාජවල ඉතිහාසය, විවිධ යුගවලදී විවිධ ස්වරූපයන් ගත් පංති ප්‍රතිඝතවල සංවර්ධනයෙන් සමන්විත වී තිබීමය.

එහෙත් අතීත යුග කිනම් ස්වරූපයක් ගත්තද, ඒ සියලු යුගවලට පොදු වූයේ සමාජයේ එක් කොටසක් අනිත් කොටස් සූරාකෑමයි. එබැවින් අතීත යුගවල සමාජීය විඥානය අනේක විවිධත්වයක් සහ නානාත්වයක් ප්‍රදර්ශනය කළද, එය පංති ප්‍රතිඝතිතයන්ගේ පූරණ අතුරුදහන් වීමක් සමග මිස, සම්පූරණයෙන් අතුරුදහන් විය නොහැකි යම් පොදු ආකාරයන් තුළම මිස, පොදු සංකල්පයන් තුළම ගමන් කිරීම මවිතයට කරුණක් නොවේ.

කොමියුනිස්ට් විප්ලවය සාම්ප්‍රදායික දේපොළ සබඳතාවලින් සම්පූර්ණයෙන්ම කැඩී යාමක් ඇති කරයි. එය සිය සංවර්ධනයේදී සාම්ප්‍රදායික අදහස්වලින් හාත්පසින්ම කැඩී වෙන්වී යාමක් ඇති කිරීම විමතියට හේතුවක් නොවේ.

එසේ වුවද කොමිනියුස්ට්වාදයට විරුද්ධව හඩනගන ධනවාදී චෝදනාවලට පිළිතුරු සැපයීම මින් නවත්වමු.

කම්කරු පංති විප්පවයේ ප්‍රථම පියවර වන්නේ නිර්ධන පංතිය පාලක පංතිය බවට නගා සිටුවීම බවත්, ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම බවත් අපි ඉහතින් දුටිමු.

පියවරෙන් පියවර සකල විධ ප්‍රාග්ධනය ධනපති පංතියෙන් උදුරා ගැනීමටද, රාජ්‍ය හස්තයෙහි, එනම් පාලක පංතිය ලෙස සංවිධානය වන නිර්ධන පංතිය අතෙහි සියලු නිෂ්පාදන උපකරණ මධ්‍යගත කිරීමටද, හැකි තරම් අධික වේගයකින් නිෂ්පාදන බලවේගයන්ගේ සමස්තය වැඩි කරලීමටද නිර්ධන පංතිය ස්වකීය දේශපාලන ආධිපත්‍ය පාවිච්චි කරනු ඇත.

සත්තකින්ම පටන් ගැනීමේදී දේපොලවල අයිතිවාසිකම් තුළට, ධනවාදී නිෂ්පාදන සබඳතාවයන් තුළට ඒකාධිපති ලෙස කඩා වදින්නේ නැතිව, එනම් ආර්ථික වශයෙන් නොසෑහෙන සහ තහවුරු කළ නොහැකි ඒවා සේ පෙනෙන, එනමුදු ව්‍යාපාරය ගෙනයාමේදී තවදුරටි ඉදිරියට ගමන් කරන, පැරණි සමාජ ක්‍රමය තුළට තවදුරටත් කඩා වැදීම අවශ්‍ය කරන්නා වූ පියවරවල් නොගෙන, මෙය සපුරාලිය නොහැකිය.

සත්තකින්ම මේ පියවරවල් විවිධ රටවල විවිධාකාර වන්නේය.

එසේ වුවද, පහත සටහන් පියවරයන් ඉතා දියුණු රටවල් වලට පොදුවේ බොහෝ දුරට ගැළපේ.

1. ඉඩම් අයිතිය අහෝසි කරලීම සහ ඉඩම්වලින් ලැබෙන සියලු බදුකුලී රජයේ වියදම් සඳහා යෙදවීම.

2. ඉහල මට්ටමේ අනුක්‍රම අය බද්දක් හෝ ක්‍රමාංකික අයබද්දක් පැනවීම.

3. ජන්මයෙන් දේපොල අයිතිවීමේ සියලු අයිතිය අහෝසි කරලීම.

4. සියලු විශ්‍රාමිකයන්ගේ සහ සියලු කැරළි කරුවන්ගේ දේපොල රාජසන්තක කිරීම.

5. රාජ්‍ය ප්‍රාග්ධනයෙන් සහ සුවිශේෂ ඒකාධිකාරයකින් යුත් ජාතික බැංකුවල මාධ්‍යයෙන් ණය ගනු දෙනු රජය අත මධ්‍යගත කිරීම.

6. ප්‍රවාහන මාධ්‍යයන් රාජය අත මධ්‍යගත කිරීම.

7. රජය සතු කර්මාන්ත ශාලාවලත්, නිෂ්පාදන උපකරණවලත් සංඛ්‍යාව වැඩි කිරීම, පොදු සැලැස්මයකට අනුකූලව මුඩු බිම් වගා කිරීම සහ පස සශ්‍රික කිරීම.

8. සියලු දෙනාටම එක හා සමාන ශ්‍රම වගකීමක් ඇති කරලීම. කෘෂිකර්මය සඳහා විශේෂ වූ සහ වෙනත් කාර්මික හමුදාද පිහිටුවාලීම.

9. කෘෂිකර්මය කර්මාන්ත සමග සම්බන්ධ කරලීම. ජනගහනය වඩාත් සමාන ලෙස රට පුරා විසුරුවා හැරීම මගින් නගරයත් ගමත් අතර ඇති වෙනස තුරන් කරලීම.

10. සියලු ළමයින්ට ප්‍රසිද්ධ පාසල්වල නොමිලේ අධ්‍යාපනය ලබාදීම, කර්මාන්ත ශාලාවල ළමයින්ගෙන් වැඩ ගැනීමේ අද්‍යතන ක්‍රමය අහෝසි කිරීම□ අධ්‍යාපනය කාර්මික නිෂ්පාදනය සමග සංයෝජනය කරලීම, ආදිය වේ.

සංවර්ධන ක්‍රියා සංතතියේදී පංති ප්‍රභේද නැති වී මුළු මහත් නිෂ්පාදනයම පුද්ගලයින්ගේ දැවැන්ත සමාගමයක් තුළ සංකේන්ද්‍රනය වූ විට, පොදු බලයේ දේශපාලනමය ස්වරූපය අහෝසි වී යනු ඇත. වචනයේ පරිසමාප්ත අර්ථය අනුව දේශපාලන බලය යනු එක් පංතියක් විසින් තවත් පංතියක් පෑගීම සඳහා සාදා ඇති සංවිධානාත්මක බලයයි. නිර්ධනීන් ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේදී අනිවාර්යයෙන්ම පංතියක් වශයෙන් සමගි වන්නේ නම්, පාලක පංතිය ලෙස එය පැරණි නිශ්පාදන සබඳතාවයන් බලාත්කාරයෙන් ඉවත ලන්නේ නම් එවිට නිර්ධන පංතිය, පංති ප්‍රතිඝතයන් පැවත්වීමේ තත්තවයන් නැති කරලයි, පොදුවේ පංතීන්ගේ පැවැත්මද අහොසි කර දමයි. එසේ කිරීමෙන් පංතියක් වශයෙන්, ස්වකීය ආධිපත්‍යද අහෝසි කරලයි.

පංතිවලින් සහ පංති ප්‍රතිඝතවලින් සමන්විත පැරණි ධනවාදී සමාජය වෙනුවට, හැම කෙනෙකුගේම ස්වාධීන සංවර්ධනය, සියලු දෙනාගේම ස්වාධීන සංවර්ධනයේ කොන්දේසියක් බවට පත්වන සමාගමයක් ඇති වන්නේය.

# III. සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍ය

## 1. ප්‍රතිගාමී සමාජවාදය

### (අ) රදල සමාජවාදය

ප්‍රංශ හා ඉංග්‍රීසි රදල පෙළැන්තිය සිය ඓතිහාසික තත්තවයන් නිසාම, සමකාලීන ධනවාදී සමාජයට විරුද්ධව පත්‍රිකා ලිවීම වෘත්තියන් බවට පත් කරගත්තේය. 1830 ජුලි මස සිදු වූ ප්‍රංශ විප්ලවයේදීද පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේදීද, තම වෛරයට පාත්‍ර වූ මේ උද්දච්චයා යළිත් වරක් මේ රදළ පෙළැන්තියට පරාජය ගෙන දුන්නේය. එතැන් සිට බැරෑරුම් දේශපාලන අරගලයක් කිරීම ගැන සිතීමට පවා නොහැකි විය. ඉන් පසු කළ හැකි වූයේ සාහිත්‍යමය අරගලයක් පමණකි. එහෙත් සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි වුවද, පුනඃස්ථාපන යුගය යළි පිහටුවාලීම සඳහා යෙදූ පැරණි වාක්‍ය ඛණ්ඩ යෙදවීම තවදුරටත් කළ නොහැකි විය. *(ඉංග්‍රීසි පුනඃස්ථාපන සමය (1660-1689) නොව ප්‍රංශ පුනඃස්ථාපන සමය (1814-1830) ගැනය. - 1888 සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි. )* අනුකම්පාව ඇවිස්සවීම සඳහා, තම අයිතිවාසිකම් සහ වුවමනාවන් අමතක කර දමා ඇති බවක් මවාපාමින්, සූරාකෑමට භාජනය වූ කම්කරු පංතියේ අයිතිවාසිකම් හා වුවමනාවන් වෙනුවෙන් පමණක් ධනපත් පංතියට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරන බව පෙන්වීමට රදළ පෙළැන්තියට සිදුවිය. තම නව ස්වාමියාට විරුද්ධව නින්දා සහගත ලිපි ලියමින් සහ ළඟාවෙමින් පවතින විනාශය ගැන අනාවැකි ඔහුගේ කනට කොඳුරා කියමින් සෑහීමට පත්වීමට රදළ පෙළැන්තියට සිදු විය.

රදළ සමාජවාදය බිහි වූයේ මේ ලෙසිනිඃ එය අර්ධ විලාපයකි. අඩ වශයෙන් නින්දා සහගත ලියවිල්ලකි. අතීතයේ අර්ධ දෝංකාරයකි. අනාගතය අරභයා වූ අර්ධ තර්ජනයකි. එය සමහරවිට, සිය තිත්ත, උපහාසජනක, තියුණු ලෙස කා වදින විවේචන මගින් ධනපති පංති හදවතේ අරටුවට එල්ල කරයි. එනමුදු හැමවිටම එය සමකාලීන ඉතිහාසයේ ඉදිරි ගමන වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම අපොහොසත් වන බැවින්, හැමදාම පූරණ හැස්‍යජනක හැඟීමක් ඇති කරලයි.

මහජනතාව තමා වටා එක්රැස්කරගනු පිණිස රදළ පෙළැන්තිය ධජයක් වෙනුවට නිර්ධන පංතියේ හිඟන පසුම්බිය වැනුවේය. එහෙත් ජනතාව ඔවුන් සමග එක්වූ හැම විටෙකම ඔවුන්ගේ පසුපස පැරණි රදළ චිහ්න දුටුවෙන්, හඩ නගමින් සහ ගරු සරු රහිත සිනහ පාමින් ඔවුහු ඔවුන්ගෙන් ඈත් වූහ.

ප්‍රංශ ලෙජිටිමිස්ට් වරුන්ගේන් කොටසක් සහ "යෞවන එංගලන්ත කාරයෝ" [31] මේ හාස්‍යය ජනක නාටකය රඟ පෑහ.

රදළයෝ සූරාකෑමේ විධිය, ධනවාදී සූරාකෑමට වඩා වෙනස් බව පෙන්වා දෙන්නෝ නම්, ඔවුහු මීට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වූද, දැනට යල්පැන ඇත්තා වූද අවස්ථාවන් හා තත්වයන් යටතේ සූරා කෑම බව අමතක කරති. සිය පාලනය යටතේදී වත්මන් නිර්ධන පංතිය කිසි කළෙකත් නොපැවති බව පෙන්වා දෙන ඔවුහු, සමකාලීන ධනපති පංතිය තම සමාජ ක්‍රමයේ අනිවාර්‍ය ප්‍රතිපලයක් බවද අමතක කරති.

කෙසේ වුවද, ඔවුන් තම විවේචනයෙහි වූ ප්‍රතිගාමී ස්වරූපය කෙතරම් අල්ප වශයෙන් සඟවතිදයත්, ධනපති පංතියට විරුද්ධව ඔවුහු ඉදිරිපත් කරන ප්‍රධන චෝදනාවේ තේරුම, පැරණි සමාජ ක්‍රමය පුපුරුවා දමන පංති යක් ධනපති ආධිපත්‍ය යටතේ වර්ධනය වෙමින් පතිනනේය යනුයි.

ධනපති පංතිය නිර්ධන පංතියක් පිහිකිරීම ගැන නොව, විප්ලවවාදී නිර්ධන පංතියක් බිහි කිරීම ගැන රදළයෝ වඩාත් වැඩියෙන් ධනපති පංතියට චෝදනා කරති.

එබැවින් දේශපාලන ප්‍රායෝගික කටයුතු වලදී රදළයෝ කම්කරු පංතියට විරුද්ධව සියලු ප්‍රචන්ඩ ක්‍රියාවන්ට සහභාගී වෙති. එමෙන්ම සාමාන්‍ය ජීවිතයේදී ඔවුහු කෙතරම් වගාඩම්බර කථා දෙසා බෑවද, කර්මාන්තය නැමැති කප්රුකෙන් ස්වර්ණමය එල නෙලා ගැනීමටද, බැටළු ලොම්, බීට් අලවලින් සාදන සීනි සහ අර්තාපල්වලින් පෙරන ලද මත්පැන් විකණීම සඳහා භක්තිය, ආලය සහ ගරුත්වය හුවමාරු කර ගැනීමේ තත්ත්වය දක්වා පහතට වැටී සිටිති.

පූජකයා හැමදාම ඉඩම් හිමි රදළයා සමග අත්වැල් බැඳගෙන ගමන් කළාක් මෙන්ම, පූජක සමාජවාදය ද, රදළ සමාජවාදය සමග අත්වැල් බැඳගෙන ගමන් කරයි.

ක්‍රිස්තියානි තපසට සමාජවාදී පැහැයක් දීම තරම් වෙනත් පහසු දෙයක් නොමැතී කිතුණු දහම පෞද්ගලික දේපොළවලට විරුද්ධවත්, විවාහයට විරුද්ධවත්, රජයට විරුද්ධවත් ව්‍යක්ත ඝෝෂාවක යෙදී නැතිද? මේවා වෙනුවට කිතුනු දහම දන්දීම සහ දුගී බවද, බ්‍රහ්මචරියාව සහ කයට වධදීමද, ආශ්‍රම ජීවිතය ද දේශනා නොකළේද? කිතුනු සමාජවාදය අන් කිසිවක් නොව, රදළයාගේ කෝපය නිවාලනු පිණිස පූජකයා ඉසින ආසිරිපැන් පමණකි.

### (ආ) සුළු ධනපති සමාජවාදය

ධනපති පංතිය විසින් විනාශ කර දමනු ලැබූ, සමකාලීන ධනවාදී සමාජය තුළ සිය ජීවන තත්වයන් හීන වී ගිය, සහ අභාවයට පත් වී ගිය එකම පංතිය රදළ පෙළැන්තිය පමණක් නෙවේ. මධ්‍යකාලීන යුගයේ නගරවැසි කොටස්ද, සුළු ඉඩම් හිමි ගොවියෝද සමකාලීන ධනපති පංතියේ පුරෝගාමීන් වූහ. *(මෙය ජර්මනියට ප්‍රධාන වශයෙන් ගැලපෙයි. එහි ඉඩම් හිමි දළ පෙළැන්තිය සහ ගම්බද ඉඩම් හිමි යුන්කර්වරු තම වතු හා ඉඩම් රටවලින් අති විශාල කොටසක් බාරකරුවන්ගේ මාර්ගයෙන් වගා කරවා ගත්හ. එමෙන්ම ඔවුහු බීට් සීනිවලින් සහ අර්තාපල් වලින් මත් පැන් පෙරන්නන්ද වූහ. වඩාත් පෙහොසත් බ්‍රිතන්‍ය රදළ පෙළැන්තිය මෙතරම් පහතට වැටී නැත. එහෙත් ඔවුහුද ව්‍යාජමය බද්ධ ව්‍යාපාර වස්තු වෙළඳ සමාගම් සෑදීමට තම නම් පාවිච්චි කිරීමට ඉඩදීම මගින් පහත වැටෙමින් පවතින බදු මුදල්වල පාඩුව පිරිමසාලීමේ ආකාරය නොදන්නෝ නොවෙති. (1888 ඉංග්‍රීසි මුද්‍රණයට එංගල්ස් ලියූ සටහනකි.)*

නවීන ශිෂ්ඨත්වය පූර්ණ වර්ධනයක් ලබා ඇති රටවල ධනපති සමාජයේ අතිරේක කොටසක් ලෙස, නිතර අළුත් වැඩියා වෙමින් පවතින සුළු ධනවාදීන්ගේ නව පංතියක් සෑදී ඇත. මෙය නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර වැනෙමින් පවතී. එහෙත් තරඟයේ ප්‍රතිඵලයක් වශයෙන්, මේ පංතියට අයත් තනි, තනි සාමාජිකයෝ නිරන්තරයෙන්ම නිර්ධන පංතියට ඇද වැටෙති. එමෙන්ම මහා පරිමාණ කර්මාන්ත වර්ධනය වීමට පටන් ගැනීමත් සමගම, සමකාලීන සමාජයේ ස්වාධීන කොටසක් ලෙස සම්පූරණයෙන්ම අතුරුදහන් වීමත්, භාණ්ඩ නිෂ්පාදනයෙහි, කෘෂිකර්මයෙහි සහ වාණිජයෙහි තමන්ට අයත් වැ තිබූ ස්ථානවලට ඕවර්සියර්ස්වරුන්, වතු කළමනාකරුවන් සහ වැටුප් ලබන සේවකයින් පවත්වන සැටි ඔවුනට පෙනේ.

ජනගහනය හරි අඩකටත් වඩා බොහෝ වැඩියෙන් ගොවීන් සිටින ප්‍රංශය වැනි රටවල ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතියේ පැත්ත ගත්, ගත්කරුවන් ඇතිවීම ස්වභාවික දෙයක් විය. මොවුහු ධනපති පාලනයට විරුද්ධව කළ විවේචන වලදී සුළු ධනපතියාගේ සහ සුළු ගොවියාගේ මිම්ම පාවිච්චි කරමින්, සුළු ධනවාදී ස්ථාවරයක පිහිටා කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළහ. මෙලෙස සුළු ධනවාදී සමාජවාදය බිහිවිය. ප්‍රංශයෙහි පමණක් නොව එංගලන්තයෙහිද සිස්මොන්ඩ් [82] මේ දර්ශනවාදී නිකායේ ප්‍රධානියා වූයේය.

මේ සමාජවාදී නිකාය සමකාලීන නිෂ්පාදනමය සබඳතාවයන්ගේ පරස්පර විරෝධිතාවයන් අති තියුණු ලෙස නිදහසට කරුණු දැක්වීමේ අති හිස්බව එය විසන් හෙළිකරවූ කැරණි. එය යන්ත්‍ර මගින් නිෂ්පාදනය කිරීමේද ශ්‍රම විභජනයේද විනාශකාරී විපාක ඵළයන් විවාද රහිතව පිළිගැනෙන සේ ඔප්පු කළේය. ප්‍රාග්ධනය සහ ඉඩම් අත්ලොස්සක් දෙනා අත සංකේද්‍රණයේ අරාජිකත්වයද, ධනය බෙදා හැරීමේදී ඇති වී තිබෙන සාපරාධී අසමානතාවයද ජාතීන් අතර පවතින් සමූල ඝාතන කාර්මික

යුද්ධයද, පැරණි සදාචාරමය බැඳීම් දියවීයාමද, පැරණි පවුල් සබඳතාවයනුත් පැරණි ජාතීනුත් අහෝසි වී යාම ද එය පෙන්වා දුනනේය.

එසේ වුවද මේ පන්නයේ සමාජවාදය සිය යථානුභූත පරමාර්ථ අතින් එක්කෝ භාණ්ඩ නිෂ්පාදනය සහ හුවමරුව අරභයා පැරණි ක්‍රමත් ඒවා සමග පැරණි දේපොළ සබඳතාවයන් පුනඃස්ථාපනය කිරීමට හෝ නැතිනම් නිෂ්පාදනය සහ හුවමාරුව අතින් දැනටමත් පුපුරුවා දමා ඇති හා අත්‍යාවශ්‍ය ලෙසම පුපුරුවා දැමිය යුතු පැරණි දේපොළ සබඳතාවයන්ගේ රාමුව තුළ නිෂ්පාදනය සහ හුවමාරුව පිලිබඳ සමකාලීන මාධ්‍යයන් බලාත්කාරයෙන් සිරකිරීමකට භාජනය කිරීමට අභිලාෂයක් දන්වයි. මේ සිද්ධීන් දෙකෙහිදී සුළු ධනපති සමාජවාදය එකවරම ප්‍රතිගාමීය, මනෝරාපික වාදීය.

කර්මාන්තයෙහි ශ්‍රේණි සංවිධානයද, කෘෂිකර්මයෙහි පීතෘ මූලික සබඳතාවයන්ද මේ පන්නයේ සමාජවාදයේ අවසාන වචන වන්නනේය.

තවදුරටත් සිය සංවර්ධනයේදී මේ ප්‍රවණතාවය බිය සුලු මූර්ඡාවකට ඇද වැටෙයි.

## (ඇ) ජර්මන් හෙවත් සැබෑ සමාජවාදය

ආධිපත්‍යට පැමිණ සිටින ධනපති පංතියේ පීඩනට යටතේ ඇති වූ මෙම ආධිපත්‍යයට විරුද්ධව ගෙන ගිය අරගල ප්‍රකාශයට පත් කළ සාහිත්‍යයක් වූ ප්‍රංශයේ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍යය ජර්මනියට ඉදිරිපත් කරනු ලැබුවේ එරටේ ධනපති පංතිය රදළවාදී ඒකාන්තවාදයට විරුද්ධව සිය අරගලය ආරම්භ කළ කාලයේදීමය.

ජර්මන් දාර්ශනිකයෝද අර්ධ දාර්ශනිකයෝද, අලංකාර වාග් පාඨ දෙඩවීමෙහි රිසියෝ ද ඉමහත් ආශාවකින් යුතුව මෙම සාහිත්‍යය බදා වැළඳගත් නමුදු, මේ සාහිත්‍ය කෘතීන් ප්‍රංශයේ සිට ජර්මනියට සංක්‍රමණය වන විට, ඒ සමගම ප්‍රංශයේ සමාජය තත්ත්වයන්ද ජර්මනියට සංක්‍රමණය නොවූ බව ඔවුහු අමතක කළහ. ජර්මනියේ සමාජ තත්ත්වයන් ඉදිරියේ මේ ප්‍රංශ සාහිත්‍යයෙහි සෘජු ව්‍යවහාරික වැදගත්කම සම්පූරණයෙන් නැතිවී, හුදු සාහිත්‍යමය ප්‍රවණතාවයක් පමණක් ගත්තේය. විය යුතු පිරිද්දෙන්ම, මෙළෙස දහඅට වැනි සියවසරේ ජර්මන් දාර්ශනිකයන්ට පළමුවැනි ප්‍රංශ විප්ලවයේ ඉල්ලීම්, හුදෙක් ව්‍යවහාරික බුද්ධියේ ඉල්ලීම් හැටියට පෙනිණි. විපලවවාදී ප්‍රංශ ධනපති පංතියේ අධිෂ්ඨානය පිළිබඳ ප්‍රකාශනය, පොදු වශයෙන් වූ නියම මානව අධිෂ්ඨානයේ නීති ලෙස ඔවුනට පෙනිණි.

අභිනව ප්‍රංශ සංකල්ප සිය පැරණි දාර්ශනික හෘදය සාක්ෂීය සමග සංගතික ලෙස ගළපා ගැනීමට පමණක් නැතිනම් සිය දාර්ශනික අදහස් බැහැර නොකර ප්‍රංශ සංකල්ප ඈඳා ගැනීම තම කෘති මගින් ජර්මන් සාහිත්‍ය වේදීහු කළහ.

අනුවාදය මගින් විදේශීය භාෂාවක් උකහා ගන්නා අන්දමට, මෙම උකහා ගැනීමද සිදු විය.

කිතුනු සමය නොදත් පැරණි ලෝකයේ ආවීර්ණ කල්පික ග්‍රන්ථ වල මුල් පිටපත් මතු පිට පූජකයන් විසින් කතෝලිකාගමේ ශුද්ධවන්තයින්ගේ ජීවන චරිත අමන ලෙස ලියන ලද ආකාරය සුප්‍රකටය. ධර්ම ඥානයෙන් තොර වූ ලෞකික සාහිත්‍ය අරභයාද, ජර්මන් සාහිත්‍ය වේදියෝ මෙම ක්‍රියාදාමය අනිත් අතට යෙදවූහ. ප්‍රංශ මුල් පිටපත්වලට යටින්, ඔවුහු සිය දාර්ශනික පල්හෑලි ලියා තැබූහ. නිදසුනක් වශයෙන්, මුදල්වල ආර්ථික කාර්යයන් පිළිබඳව ප්‍රංශ විවේචනයට යටින් ඔවුහු "මනුෂ්‍යත්වය අන්සතු කිරීම" ලියූහ. ධනවාදී රජය පිළිබඳව ප්‍රංශ විවේචනයට යටින් "වියුක්ත-ව්‍යාප්තියේ ආධිපත්‍ය නැති කර දැමීම" ආදිය ලියූහ.

ප්‍රංශ න්‍යායයට යටින් සිය දර්ශනවාදී වාක්‍ය බන්ඩ ඉදිරිපත් කිරීම ඔවුන් හැඳින්වූයේ "ක්‍රියාකාරීත්වයේ දර්ශනවාදය", "සැබෑ සමාජවාදය", "සමාජවාදයේ ජර්මන් විද්‍යාව", "සමාජවාදයේ දාර්ශනික පදනම" ආදී වශයෙනි.

මේ අන්දමට ප්‍රංශ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍ය සම්පූර්ණයෙන්ම දුර්වල කරන ලදී. තවද ජර්මන් කාරයා අතට පත් වූ එම සාහිත්‍යයෙන් එක් පංතියක් තවත් පංතියකට විරුද්ධව ගෙනයන අරගලය ප්‍රකාශ කිරීම නිමාවට පත් වූ නිසා මෙයින් "ප්‍රංශ ඒක පාර්ශවිකත්වය" අභිභවා නැගී සිටයේ යැයිද, සත්‍ය වුවමනාවෙන් නොව, සත්‍යයේ වුවමනාවන්, නිර්ධන පංතික වුවමනාවන් නොව, මිනිස් ස්වභාවයේ වුවමනාවන්, කිසිඳු පංතියකට අයත් නැති, යථාර්ථවාදී නොවන දර්ශනවාදී මනස් සෘෂ්ටිය නැමැති මීදුම් පටලයක් තුළ පවතින මිනිසාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බව ඔහුට හැඟිණි. තම සිප්කැම් අභ්‍යාසය මෙතරම් භාර දූර ලෙස සහ ගාම්භීර ලෙස හිසට ගත්තා වූ සහ එය මෙතරම් කෑකෝ ගසමින් වර්ණනා කළා වූ මෙම ජර්මන් සමාජවාදය, සිය පණ්ඩිත මානීත්වය ටිකෙන් ටික නැති කර ගත්තේය.

රදළ පෙළැන්තියට සහ නිරපේක්ෂ රාජාණ්ඩුවට විරුද්ධව ගෙනගිය ජර්මන් ධනපති පංතියේ, විශේෂයෙන් ප්‍රුසියන් ධනපති පංතියේ සටන, එක් වචනයකින් කියතොත්, ලිබරල්වාදී ව්‍යාපාරය වඩාත් බැරෑරුම් විය.

දේශපාලන ව්‍යාපාරය ඉදිරිපිට සමාජවාදී ඉල්ලීම් ඉදිරිපත් කිරීමටත්, ලිබරල්වාදයට විරුද්ධවද, නියෝජිත ආණ්ඩු ක්‍රමයට විරුද්ධවද, ධනවාදී තරගයට, ධනවාදී පුවත්පත් නිදහසට, ධනවාදී ව්‍යවස්ථාපනයට, ධනවාදී නිදහසට සහ සමානාත්මතාවයට විරුද්ධවද පාරම්පරික අභිශාප ඉදිරිපත් කිරීමටත්, මේ ධනවාදී ව්‍යාපාරය මගින් තමන්ට දිනා ගැනීමට කිසිවක් නැති අතර හැම දෙයක්ම නැති වී යාමේ අනතුරට මුණ පාන බව දේශනා කිරීමටත්, මේ මගින් "සැබෑ" සමාජවාදයට දිගු කලක් තිස්සේ පතමින් සිටි ස්වර්ණමය අවස්ථාව ලැබිණි. ජර්මනියේ ඒවා දිනා ගැනීම අවශ්‍යය යන අරමුණු වල පමණක් තවමත් තිබෙන පූර්වාවයවයන්, එනම් ආර්ථිකමය ජීවන තත්වයන් සහ එයට ගැළපෙන සේ සකස්වුණු දේශපාලන ව්‍යවස්ථාවකින් යුක්තව සමකාලීව ධනවාදී සමාජය පවතින බව ප්‍රංශ විවේචනය පූර්ව කල්පනාවෙක යෙදුණු බැවි, එහිම සංවේගදායී දෝංකාරයක් වූ ජර්මන් සමාජවාදය අවශ්‍යතම මොහොතේදී අමතක කළේය.

පූජකයින්, පාඨශාලා අධිකාරීන්, ගම්බද ඉඩම් හිමි යුන්කරයින් සහ නිළධාරීන් පිරිවර කොට ගත් ඒකාන්තවාදී නිරපේක්ෂ ආණ්ඩු වලට නම් මේ සමාජවාදය, තමන්ට තර්ජනය කරමින් නැගී එන ධනපති පංතියට විරුද්ධ පාවිච්චි කළ හැකි පඹයකු විය.

එය, ජර්මන් කම්කරු පංතික කැරළි පාගා දැමීම පිණිස අවියක් ලෙස ආණ්ඩුවලට ආධාර වූ අතර එය වී සමගම ප්‍රතිගාමී වුවමනාවන්, එනම් ජර්මන් අවරසිකයන්ගේ වුවමනාවන් සෘජු ලෙසම නියෝජනය කළේය. දහසය වැනි සියවසරේ අවශේෂයක් වූ එතැන් සිට එක් හෝ තවත් ආකාරයකින් නිරන්තරයෙන්ම යළි යළිත් මතුවෙමින් පැවති සුළු ධනපති පංතිය ජර්මනියේ දැනට පවතින තත්වයන්ගේ යථාර්වාදී සාමාජීය පදනම වේ.

මේ පංතිය රැක ගැනීම, ජර්මනියෙහි දැනට බලපාන තත්ත්වය ආරක්ෂා කර ගැනීමය. ධනපති පංතියේ කාර්මික සහ දේශපාලනමය ආධිපත්‍යය එක් අතකින් ප්‍රාග්ධනය සංකේන්ද්‍රනය වීමෙන්ද, අනෙක් අතින් විප්ලවවාදී නිර්ධන පංතියේ වර්ධනයෙන් ද මෙම පංතිය සිය විනාශය බියෙන් යුතුව බලා සිටී. එක් වෙඩි පහරකින් හාවුන් දෙදෙනෙකු මරා දැමීමට "සැබෑ" සමාජවාදය බිහිවී තිබෙන බව එයට දැනුනාක් මෙනි. "සැබෑ" සමාජවාදය වසංගතයක් මෙන් පැතිරිණි.

අලංකාරෝක්තිය නැමත පුෂ්පයෙන් ගෙත්තම් කළ, මෘදු චිත්තවේගය නැමති කඳුලින් පොඟවා, කාල්පනිකය නැමති මකුළුදැලෙන් ගොතන ලද මායාකාරී වස්ත්‍රය, ජර්මන් සමාජවාදීන් විසින් සිය

කෙට්ටු "සදාකාලික සත්‍යයන්" දැවටීම සඳහා පාවිච්චි කළ මේ උත්කෘෂ්ට වස්ත්‍රය, එබඳු ජනගහනයක් ඉදිරියේ ඔවුන්ගේ භාණ්ඩ අලෙවිය වැඩි කිරීමට පමණක් උපකාරී විය.

ජර්මන් සමාජවාදාය තම පැත්තෙන්, සුළු ධනපති අවරසිකත්වයේ පුරාජේරුකාර නියෝජිතයා වශයෙන් වූ තම කාර්‍ය කොටස වඩාත් හොඳින් වටහා ගත්තේය.

ආදර්ශවත් ජාතිය ජර්මන් ජාතිය බවත්, නියම ආදර්ශවත් මිනිසා ජර්මන් සුළු ධනවාදී අවරසිකයා බවත්, එය ලොවට ප්‍රකාශ කළේය. මෙම ආදර්ශවත් මිනිසා කරන සෑම දුෂ්ඨ නීච ක්‍රියාවකටම, එය එම ක්‍රියාවකට සැබෑ මුණුවරට වඩා හාත්පසින්ම වෙනස් වූ ගුප්තමය, උසස් සමාජවාදී අර්ථකථනයක් දුන්නේය. "රළු ලෙස විනාශකාරී වූ" කොමියුනිස්ට්වාදී ප්‍රවනතාවයට සෘජු ලෙසම විරුද්ධ වීමත් සියලු පංති අරගල කෙරෙහි වූ සිය උත්තරීතර පිළිකුල ප්‍රකාශ කර ලීමටත් තරම් වූ අන්තයකට එය ගියේය. ජර්මනියෙහි දැනට (1847) ප්‍රචාරය වන ඊනියා සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී පොත්පත් වලින් ඉතා සුළු සංඛ්‍යාවක් හැර අන් සියල්ල මෙම තුච්ච සාහිත්‍ය ගණයට අයත්ය.

## 2 ගතානුගතික හෙවත් ධනපති සමාජවාදය

ධනපති සමාජයේ පැවැත්ම සහතික කරනු පිණිස සමාජීය දුක්ගැනවිලි වලට පිළියම් කිරීමට ධනපති පංතියෙන් සෑහෙන කොටසක් කැමැත්ත දක්වයි.

මෙම කොටසට ආර්ථිකවාදීන්, පරාර්ථචර්‍යාවාදියෝ, මානව හිතවාදියෝ, කම්කරු පංතියේ තත්ත්වය උසස් කිරීමට ආශා කරන්නෝ, පුණ්‍ය කර්මයන් සංවිධානය කරන්නෝ, තිරිසනුන්නට වදදීම වළක්වන සමාජවල සාමාජිකයෝ, අමද්‍යප වීරයෝ, හැමතැනම සැටින විවිධ සමාජ ප්‍රතිසංස්කරණ වාදියෝ ආදිය අයත්වෙති. මේ වර්ගයේ සමාජවාදය අංග සම්පූර්ණ පද්ධති බවට සකස්කොට ඇත. (1848 කුණාටුව මේ අශෝභන ප්‍රවනතාවය එහෙම පිටින්ම ඉවතට ගෙන ගොස්, සමාජවාදය අතගෑමට ආශා කළ ධාරකයින්ගෙන් එය උදුරා ගන්නා ලදී. මෙම ප්‍රවනාතාවයේ ප්‍රධාන නියෝජිතයා සහ සදාතනික ආකෘතිය වූයේ කාල් ග්‍රෑන්ය[34] - 1890 ජර්මන් මුද්‍රණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි.)

ප්රුදොන් විසින් ලියන ලද "දුගී බවේ දර්ශනවාදය" මේ වර්ගයට නිදසුනක් සේ දැක්විය හැකිය.

සමකාලීන සමාජ තත්ත්වයන් නිසා අනිවාර්‍යයෙන්ම පැනනගින අරගලයන් සහ අනතුරු රහිතව තම පැවැත්මේ තත්ත්වයන් ආරක්ෂා කර ගැනීමට ධනපති සමාජවාදීන්ට අවශ්‍ය වී ඇතී විප්ලවවාදී සහ දිරාපත් කරවන කොටස් වලින් තොරව, දැනට පවතින ධනපති ක්‍රමය රැකගැනීම ඔවුන්ගේ අභිප්‍රාය වන්නේය. නිර්ධන පංතියක් රහිත ධනපති පංතියක් ඔවුන්ට උවමනාය. ධනපති පංතියේ ආධිපත්‍ය ඇති ලෝකයක් ඉතාම හොඳ ලෝකයක් බව එම පංතිය අදහස් කිරීම ස්වභාවික දෙයකි. ධනපති සමාජවාදය මේ සැනසිලිදායක සංකල්පනය අඩු වැඩි වශයෙන් අංග සම්පූර්ණ පද්ධති බවට වර්ධනය කරයි. එවැනි සමාජ වාදී ක්‍රමයක් ක්‍රියාවේ යොදවන ලෙසද, එය ඔස්සේ සාමාජීය නව ජෙරුසෙලමක් කරා එක එල්ලේම ගමන් කරන ලෙසද, එය නිර්ධන පංතියට යෝජනා කරන විට, එය සැබවින්ම ඉල්ලා සිටින්නේ නිර්ධන පංතිය දැනට පවතින ධනපති පංතියට තවදුරටත් වෛර නොකළ යුතු බවද එය ඉල්ලා සිටී.

ජීවත්වීමේ ද්‍රව්‍යමය තත්ත්වයන්, ආර්ථික සබඳතාවයන් වෙනස් කිරීමෙන් පමණක් මිස, හුදු දේශපාලන ව්‍යාපාරයෙන් කිසි සෙතක් ඇති නොවන බව පෙන්වා දීමෙන්, කම්කරු පංතිය ඉදිරියෙහි හැම විප්ලවවාදී ව්‍යාපාරයක්ම හෙළා දැකීමට මෙම සමාජවාදයේම එනමුදු වඩාත් වැඩියෙන් ප්‍රායෝගික, වඩාත් අඩුවෙන් ක්‍රමානුකූල තවත් වර්ගයක් වෑයම් කළේය. ජීවත්වීමේ ද්‍රව්‍යමය තත්ත්වයන් වෙනස් කිරීම යන්නෙන් මේ වර්ගයේ සමාජවාදය, විප්ලවයකින් පමණක් සිදු කළ හැකි ධනවාදී නිෂ්පාදන සබඳතාවයන් විනාශකර දැමීමක් කොහෙත්ම අදහස් නොකරයි. එහෙත් එය ධනවාදී නිෂ්පාදන

සබඳතාවයක් මත පදනම් වූ පරිපාලන ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම පමණක්, ප්‍රාග්ධනයත්, ශ්‍රමයත් අතර ඇති සබඳතාවයන්ට කිසිඳු හානියක් නො කරන නමුදු හොඳටම වැඩි වුණොත් ධනපති ආණ්ඩුවේ පරිපාලන වියදම් අඩු කරන සහ එම පරිපාලනය ලිහිල් කරන ප්‍රතිසංස්කරණ ඇති කිරීමක් අදහස් කරයි.

ධනපති සමාජවාදය එයට සෑහෙන පමණින් පැහැදිලි ලෙස ප්‍රකාශ වන්නේ, එය හුදු අලංකාර භාෂා ශෛලියකට පරිවර්තනය වූ විට පමණකි.

නිදහස් වෙළඳාම! කම්කරු පංතියේ අභිවෘද්ධිය සඳහාය. ආරක්ෂක තීරු බදු! කම්කරු සෙත පිණිස වන්නේය. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ! කම්කරු පංතියේ වුවමනාවන් සඳහාය - අවසාන වචන ධනපති සමාජවාදය බැරෑරුම් අර්ථයකින් යුතුව ප්‍රකාශ කළ එකම වචනයයි.

ධනපති සමාජවාදයේ හරය එක් පාඨයක් තුළ සම්පිණ්ඩනය වී ඇත - එනම් ධනපතියා ධනපතියෙකි, එහෙත් කම්කරු පංතියේ අභිවෘද්ධිය පිණිසය.

## 3 විවේචක - මනෝරාජික සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය

නූතන කාලයේ හැම ශ්‍රේෂ්ඨ විප්ලවයකදීම නිර්ධපංතියේ ඉල්ලීම් ප්‍රකාශ කළ (බබේෆ්[35] ආදීන්ගේ කෘති වැනි) සාහිත්‍ය ගැන අපි මෙහිදී සටහන් නොකරමු.

රදළවාදී සමාජ ක්‍රමය පෙරළාදැමූ අවධියේදී, හැමතැනම කැළඹීම් පැවති කාලයේදී සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා නිර්ධන පංතිය සෘජු ලෙසම දරූ ප්‍රථම වෑයම, එවකට නිර්ධන පංතියේ පැවති නොදියුණු තත්ත්වයන් නිසාත්, තම පංතියේ විමුක්තිය සඳහා අත්‍යාවශ්‍ය ආර්ථික තත්ත්වයන් නොතිබුණු නිසාත් (නොමැතිවීම නිසාත්) නොවැලැක්විය හැකි සේ අසාර්ථක විය. මන්දයත් එම අත්‍යවශ්‍ය තත්ත්වයන් ධනවාදී අවධිය විසින් බිහිකළ යුතුව තිබුණු තත්ත්වයන් බැවිනි. නිර්ධන පංතියේ මේ ප්‍රථම ව්‍යාපාර සමග පැන නැගී විප්ලවවාදී සාහිත්‍යට අනිවාර්ය ලෙසම ප්‍රතිගාමී ස්වරූපයක් තිබුණි. එය විශ්වතපස් දහමත් ඉතා රළු වර්ගයේ සමාජීය සමතලා කිරීමකුත් දේශනා කළේය.

සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී ක්‍රමයන් යැයි යෝග්‍ය ලෙස නම් කරන ලද සෙන්-සිමෝන්, පූරියේ, ඕවන්[35] ආදීන්ගේ ක්‍රම බිහිවූයේ ඉහත විස්තර කරන ලද නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර පැවති අරගලයේ මුල් නොදියුණු වකවානුවේදීය. ("ධනපතියෝ සහ නිර්ධනයෝ" නැමති 1 කොටස බලන්න. )

මේ ක්‍රම වල සම්පාදකවරු සැබවින්ම පංතීන්ගේ ප්‍රතිඝතිකතාවයද, එවකට ආදිපත්‍ය දරූ පංතිය තුළ විනාශකාරී කොටස්වල ක්‍රියාකාරීත්වය ද දුටුවෝය. එහෙත් තවමත් බිළිඳු වියෙහි පසුවන නිර්ධන පංතියට ඓතිහාසික ස්වාධීනත්වයක් හෝ ඔවුනට ආවේනික වූ දේශපාලනික ව්‍යාපාරයක් තිබෙන බවත් ඔවුහු නොදුටහ.

පංති ප්‍රතිඝතිකත්වයන්ගේ සංවර්ධනය කර්මාන්තයේ දියුණුවට සමාන වේගයකින් සිදුවන නිසා තවමත් නිර්ධන පංතියේ විමුක්තියට අවශ්‍ය ආර්ථික තත්ත්වයන් සපයා නැති බව ඔවුනට පෙනිණි. එබැවින් මෙම තත්ත්වයන් බිහි කිරීමෙහි සමත් නව සමාජ විද්‍යාවක්, නව සමාජ නියාමයන් සොයන්නට වූහ.

සමාජීය ක්‍රියාකාරීත්වයට අයත් ස්ථානය ඔවුන්ගේ පෞද්ගලික නිර්මාණශීලී ක්‍රියාකාරීත්වයට යටත්විය යුතුය. ඓතිහාසික විමුක්ති තත්ත්වයන්ට අයත් ස්ථානය මනඃකල්පිත තත්ත්වයන්ට යටත් විය යුතුය. එමෙන්ම පංතියක් වශයෙන් අනුක්‍රමයෙන් සහ ඉබේ හට ගන්නා නිර්ධන පංතික සංවිධානය මොවුන්ගේ වට්ටෝරුවක් අනුව සාදන ලද සංවිධානයට යටත් විය යුතුය. ඔවුන්ගේ මතය අනුව අනාගතයේ සමස්ත ලෝත ඉතිහාසය ඔවන්ගේ සමාජීය සැළැස්ම ප්‍රචාරය කිරීම සහ ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පෙරලීම බවට පත් වන්නේය.

වැඩියෙන්ම දුක් විඳින පංතිය, කම්කරු පංතිය බැවින් සිය ක්‍රම සම්පාදනයන් සැලැස්මානුගත කිරීමේදී එම පංතියේ අභිවෘද්ධිය ගැන ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතුය යන සවිඥ්ඥානක හැඟීම ඔවුනට ඇත. ඔවුනට නිර්ධන පංතිය පවතින්නේ එය අතිශයින්ම දුක් කරදර විඳින පංතිය යන ස්ථාවරය අනුව පමණකි.

පංති සටනේ නොදියුණු තත්ත්වය නිසාත්, ස්වකීය පරිසරය නිසාත්, මේ ගණයේ සමාජවාදීනුත් තමන් සියලු ප්‍රතිඝතිකතාවයන්ට වඩා ඉහලින් සිටින පිරිසක් ලෙස සිතා ගනිති. සමාජයේ හැම සාමජිකයකුගේම තත්ත්වය, ඉතා යහපත් තත්ත්වයක පවතින සාමාජිකයාගේ තත්ත්වය පවා උසස් කරලීමට මොවුනට උවමනාය. එම නිසා ඔවුහු නිරන්තරයෙන්ම පංති ප්‍රභේදයක් නොතකා මුළු මහත් පංතියටමත්, වඩාත් වැඩි වශයෙන් පාලක පංතියටත් ආයාචනය කරති. ඔවුන්ගේ මතය හැටියට ඔවුනගේ සැළැස්ම ගැන දැනගැනීම පමනක් සෑහේ. එවිට එය ඉතාම හොඳ සැළැස්ම බව සමාජය පිළිගනු ඇත.

මේ හේතුව නිසා ඔවුහු සියලු දේශපාලන ක්‍රියාවන්ද, විශේෂයෙන්ම විප්ලවවාදී ක්‍රියාවන්ද ප්‍රතික්ෂේප කරති. තම අරමුණු සාමාකාමී ක්‍රියා මගින් සහ කුඩා පරිමාණ අත්හදා බැලීම්, එම හේතුව නිසා අසාර්ථක වීමට භාජනය වූ අත්හදා බැලීම් මගින්ද, ආදර්ශයේ බලපෑම මගින්ද, නව සමාජීය බයිබලයක් සඳහා මග පාදාගැනීමට ක්‍රියා කරති.

නිර්ධන පංතිය තවමත් නොදියුණු තත්ත්වයක පවතින වකවානුවක, තම තත්ත්වය පිළිබඳව මනස් සෘෂ්ඨික සංකල්පයක් පමණක් ඇති කරගෙන සිටින වකවානුවක අනාගත සමාජය ගැන අඳිනු ලබන මෙවැනි මනස් සෘෂ්ඨික චිත්‍ර සමාජයේ පොදු ප්‍රතිනිර්මාණය සඳහා වූ එම පංතියේ ප්‍රථම පූර්ව හැඟීම සහිත අභිලාසයන්ට ගැලපේ.

එහෙත් මේ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍ය තුළ එමෙන්ම විවේචක කොටස්ද ඇත. ඒවා දැනට පවතින සමාජයේ සියලු පදනම් වලට පහර දෙයි. එබැවින් කම්කරු පංතියේ අධ්‍යාපනය සඳහා ඉතා අවශ්‍ය වටනා කරුණු වලින් එම සාහිත්‍ය සමන්විතය. එම සාහිත්‍ය මගින් යෝජනා කර තිබෙන පියවරයන් වන නගරය සහ ගම අතර ඇති ප්‍රතිවිරෝධතාවය නැති කිරීම ද, පවුල අහෝසි කරලීමද, වැටුප් ශ්‍රමය මගින් පෞද්ගලික ලාභ ගරා ගැනීම අහෝසි කරලීමද, සමාජීය සංඝතිය ලොවට ප්‍රකාශ කර සිටීමද, සරළ නිෂ්පාදන මෙහෙයවීමක් දක්වා රාජ්‍යයේ කාර්‍යයන් පරිවර්තනය කිරීමද යන මේ සියලු යෝජනා, එවකට යන්තමින් බිහිවෙමින් පැවති මේ සාහිත්‍ය මගින් අපැහැදිලි සහ අවිනිෂ්චිත ආදීතම ස්වරූපයන් වශයෙන් පමණක් හඳුනාගනු ලැබූ පංති ප්‍රතිඝතිකයන්ගේ අතුරුදහන් වීම වෙත යොමුවී තිබුණි. එම නිසා මෙම යෝජනා හුදු මනෝරාජික ස්වරූපයකින් යුක්තය.

විවේචක-මනොරාජික සමාජවාදාය සහ කොමියුනිස්ට්වාදයේ වැදගත්කම සහ ඓතිහාසික සංවර්ධනයත් අතර තිබෙනුයේ අපවර්තනීය සම්බන්ධකමකි. සමකාලීන පංති අරගලය වර්ධනය වන සහ නියත හැඩයක් ගන්නා ප්‍රමාණයට සමාජනුපාතිකව, අරගලයට ඉහලින් සිට එයින් ඈත් වී, වෙන්වී සිටීමේ මනස් සෘෂ්ඨික ප්‍රහාරයන්ගේ මුළු ප්‍රායෝගික වටිනාකමද, මුළු න්‍යායික සහේතුක නිදොස්භාවයද නැතිවී යනු ඇත. එමනිසා මේ ක්‍රමයේ නිර්මාතෘවරුන් බොහෝ කරුණු අතින් විප්ලවවාදී වුවද, ඔවුන්ගේ ගෝලයෝ හැමදාම ප්‍රතිගාමී නිකායවල් සැදූහ. නිර්ධන පංතියේ තවත් දුර සංවිධනය නොදකින ඔවුහු සිය ගුරුන්ගේ පැරණි මතවල තදින්ම එල්ලී සිටිති. එබැවින් ඔවුහු පංති අරගල අප්‍රාණික කිරීමටත් පංති ප්‍රතිගතිකතාවයන් සමාදානයෙන් නිරවුල්කර දැමීමටත් නොකඩවා ක්‍රියාකරති. ඔවුහු තවමත් ස්වකීය මනෝරාජික සමාජයන් අත්හදා බැලීමට සිහින දකිමින් නව

ජෙරුසෙලමේ කුඩා සැළැස්ම වන හුදකලා පැලැන්ටීස් පිහිටුවාලීමටද (යදපෑ කදකදබසෑ) අභ්‍යන්තරික ජනපද පිහිටුවාලීමටද කුඩා ඉකාරියා පිහිටුවාලීමටද ක්‍රියා කරති. මේ අහස්මාලිගා ඉදිකිරීම පිණිස ධනපතීන්ගේ හදවත් වලට සහ මුදල් පසුම්බි වලට ආයාචනය කිරීමට මොවුනට සිදුවි ඇත. ඉහතින් විස්තර කළ ප්‍රතිගාමී හා ගතානුගතික සමාජවාදීන්ගේ ප්‍රවර්ගයට මොවුන් ක්‍රමක්‍රමයෙන් වැටෙමින් සිටිති. ඔවුන් එම ප්‍රවර්ගයෙන් වෙනස්වන්නේ වඩාත් ක්‍රමානුකූල පණ්ඩිතමානීත්වය නිසාත්, තම සමාජ විද්‍යාවේ ආනුභාසම්පන්න ප්‍රතිපල පිළිබඳව ඔවුන් තුළ ඇති අන්ධභක්තිය නිසාත් පමණකි.

මේ හේතුව නිසා ඔවුහු කම්කරුවන්ගේ සියලු දේශපාලන ව්‍යාපාර වලට විරුද්ධ වෙති. නව බයිබලය කෙරෙහි ඇති අවිශ්වාසයේ විපාකයන් වශයෙන් එබඳු ක්‍රියාවන් ඇති විය හැකිය යනු ඔවුනගේ මතයය.

එංගලන්තයේ ඕවන්වාදියෝ සහ ප්‍රංශයේ පූරියේවාදියෝ පිළිවෙලින් එංගලන්තයේ චාටිස්ට්වරුන්ටද[37], ප්‍රංශයේ ප්‍රතිසංස්කරණවාදීන්ටද[38] විරුද්ධව ක්‍රියා කරති.

# IV. විවිධ රටවල විරුද්ධ පක්ෂ සම්බන්ධව කොමියුනිස්ට්වාදීන්ගේ ස්ථාවරය

දෙවැනි කොටසින් කරන ලද පැහැදිලි කිරීමෙන් ඉක්බිතිව දැනට පිහිටුවා ඇති කම්කරු පක්ෂ එනම් එංගලන්තයේ චාටිස්ට්වරුන් සහ උතුරු ඇමෙරිකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණවාදීන් කෙරෙහි කොමියුනිස්ට්වාදීන්ගේ ආකල්පය කෙබඳුද යන්න අවබෝධ කරගත හැකිය.

කම්කරු පංතියේ ක්ෂණික අරමුණු ඉටුකර ගැනීමටත්, ක්ෂණික අයිතිවාසිකම් හා උවමනාවන් ක්‍රියාත්මක කර ගැනීමටත් සටන් කරන කොමියුනිස්ට්වාදීන් අද්‍යතන ව්‍යාපාරය කරගෙන යාමේදී, අනාගතය සඳහා ද සටන් කරති. ප්‍රංශයේ කොමියුනිස්ට්වාදීන් ගතානුගතික සහ රැඩිකල් ධනපති පංතියට විරුද්ධව, සමාජප්‍රජාතන්ත්‍රවාදීන් සමග එකතුවෙති. එහෙත් එසේ කරන්නේ විප්ලවවාදී සම්ප්‍රදයේ සිට පැවති එන වාග් පාඨ සහ මායා මත විවේචනය කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප නොකරමිනි.

ස්විට්සර්ලන්තයේ කොමියුනිස්ට්වරු රැඩිකල්වාදීන්ට ආධාර දෙති. එහෙත් එසේ කිරීමේදී එම පක්ෂය එකිනෙකට ප්‍රතිවිරෝධී කණ්ඩායම් වලින් සෑදී තිබෙන බවත්, කොටසක් ප්‍රංශ ශෛලය අනුව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් බවත්, අනික් කොටස රැඩිකල් ධනවාදීන් බවත් අමතක නොකරති.

පෝලන්තයේ ජාතික විමුක්තිය සඳහා ප්‍රධානතම කොන්දේසි වශයෙන් කෘෂික විප්ලවයක් ඇති කළ යුතු යයි තරයේ ප්‍රකාශ කරන පක්ෂයට, 1846 ක්‍රාකොවු කැරැල්ල [40] ඇතිකළ පක්ෂයට කොමියුනිස්ට්වරු ආධාර කරති.

ජර්මන් ධනපති පංතිය, නිරපේක්ෂ රාජාණ්ඩුවටත්, රදළවාදී ඉඩම් හිමියන්ටත්, ප්‍රතිගාමී අවරසිකයින්ටත් විරුද්ධව විප්ලවවාදී ලෙස ක්‍රියාකරන හැම විටම ජර්මන් කොමියුනිස්ට්වරු එම පංතිය සමග එකතුවී සටන් කරති.

එහෙත් ධනපති පංතිය සිය ආධිපත්‍යයත් සමගම අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළයුතු සමාජයික සහ දේශාපාලනමය කොන්දේසි ජර්මන් කම්කරුවන් ධනපති පංතියට විරුද්ධව මෙහෙයවන අවි ලෙස ක්ෂණිකවම පාවිච්චියට ගැනීම සඳහාද, ජර්මනියේ ප්‍රතිගාමී පංතීන් ඇද වැටුනු වහාම ධනපති පංතියට විරුද්ධව සටන අරඹාලීම සහතික කරනු සඳහාද ධනපති පංතිය සහ කම්කරු පංතිය අතර ඇති ප්‍රතිසතිකතාවය පිළිබඳ වඩාත් පැහැදිලි වැටහීමක් කම්කරු පංතිය තුළ ඇතිකරවාලනු පිණිස ඔවුහු එක මොහොතක්වත් අපතේ නොයවති.

ජර්මනිය යුරෝපයේ වඩාත් දියුණු තත්ත්වයක් යටතේ පවතින නිසාත්, එංගලන්තයේ 17 වන සියවසරේදී ද, ප්‍රංශයේ 18 වන සියවසරේද සිටි නිර්ධන පංතියට වඩා ඉහමත් ලෙස දියුණු වූ නිර්ධන පංතියක් සහිතව සිදුවීමට යන ධනපති විප්ලවයකට ජර්මනිය ආසන්නවී ඇති නිසත්, තම අවධානය ප්‍රධාන වශයෙන් ජර්මනිය කෙරෙහි යොමු කරති. එමෙන්ම ජර්මනියේ ධනපති විප්ලවය ඉන් ඉක්බිතිව කත්ෂණිකව ඇතිවිය හැකි නිර්ධන පංති විපිලවයක ප්‍රාරම්භයක් විය හැකි බැවිනි.

එක් වදනකින් පවසතොත් සෑම රටකම සිටින කොමියුනිස්ට්වාදියෝ ඒ ඒ රටවල දැනට පවතින සාමජයික සහ දේශපාලනමය ක්‍රම වලට විරුද්ධව විප්ලවවාදී සෑම ව්‍යාපාරයකටම ආධාර දෙති.

මේ හැම ව්‍යාපාරයකම දේපොල පිළිබඳ ප්‍රශ්නය, එම අවධියේදී එය අඩු හෝ වැඩි හෝ වශයෙන් දියුණු ස්වරූපයක් ගත්තද ඒවා සියල්ලකම ප්‍රථම ප්‍රශ්නය ලෙස ඉදිරිපත් කරති.

අවසාන වශයෙන් සියලු රටවල ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල සමගියක් සහ එකඟතාවයක් ඇති කරවනු පිණිස හැම තැනකදීම කොමියුනිස්ට්වරු පරිශ්‍රමයක් දරති.

සිය අදහස් හා අරමුණු සැඟවීම කොමියුනිස්ට්වාදීහු පිළිකුල් කරති. දැනට පවතින සමාජීය තත්ත්වයන් ප්‍රජන්ඩකාරී ලෙස බිඳ හෙලීමෙන් පමණක් සිය අරමුණු සපුරාලිය හැකි බව ඔවුහු ප්‍රසිද්ධියේම පවසති. කොමියුනිස්ට්වාදී විප්ලවයක් ඉදිරියේ පාලක පංතීන් බියෙන් සැළෙත්වා. ස්වකීය විලංගු හැර නිර්ධනීන්ට නැති වීමට වෙන කිසිවක් නැත. දිනාගැනීමට ලෝකයක් ඔවුන්ට ඇත්තේය.

# සකල දේශවාසී නිර්ධනයිනි එක්වව්!